# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 69 — 1973 ජූලි 20 වැනි සිකුරාදා — 1973.07.20

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (II ආ) වැනි ඡේදය — පළකිරීම්

(වෙන වෙනම ගොනුකර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... | 897 | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... | 913 |
| තීරණය කළ ටෙන්ඩර්පත් පිළිබඳ දැන්වීම් ... ... | 911 | රට බීම විකිණීමට බලපත්‍ර සඳහාවූ අයදුම් පත් ... | — |
| බඩු බාහිරාදිය විකිණීම ... ... ... | 911 | වෙන්දේසි පිරිම පිළිබඳ දැන්වීම් ... | — |
| තොවුපල් වෙන්දේ හා වෙනත් වෙන්දේ විකිණීම්... ... | — | විවිධ දැන්වීම් ... ... | 915 |


සැලකිය යුතුයි.—ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 22 දරන මෝටර් වාහන (සංශෝධන) පනත ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 23 දරන ණය උගස්ගන්නන්ගේ (සංශෝධන) පනත සහ ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 24 දරන නොතාරිස් (සංශෝධන) පනත 1973 ජූලි 20 දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II කොටසේ අතිරේකයක් වශයෙන් පළවේ.

## ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

### රජයේ සැපයීම් දෙපාර්තමේන්තුව

කොළඹ 2, ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතැන විසින් (තැපැල් ලිපිනය: තැ. පෙ. 418, කොළඹ 2) පහත සඳහන් සේවයන් සඳහා ඒ ඒ දිනයන්හි පෙරවරු 9.30 තෙක් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ :—

| සේවයන් | ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දිනය |
|---|---|
| 1. 1973.07.01 සිට 1973.12.31 දක්වා මෙරට සෑදූ විදුලිකම්බි සැපයීම ... | 1973. 08. 21 |
| 2. ශුද්ධ කිරීමේ කුඩු සැපයීම ... | 1973. 08. 21 |
| 3. මෙරට නිෂ්පාදිත පිරිමින්ගේ රබර් මිශ්‍ර කළු වැහි කබා සැපයීම... ... | 1973. 08. 21 |

ඉහත සඳහන් සැපයීම් සම්බන්ධයෙන් ඒ ඒ ටෙන්ඩර්කරුවන් විසින් කොළඹ 7, බෞද්ධාලෝක මාවතේ 363 දරණ විද්‍යාත්මක හා කාර්මික පර්යේෂණ ලංකා ආයතනයෙන් තමන්ගේ සැම්පල් පරීක්ෂා කරවාගෙන ඒ සඳහා ලැබෙන සහතික පත්‍ර ස්වකීය ටෙන්ඩර්පත්‍ර සමග ඉදිරිපත් කළයුතුය.

ලංකා ප්‍රමිතිවලට අනුකූලව නිෂ්පාදිත භාණ්ඩවලට වැඩි සැලකිල්ලක් දක්වනවා ඇත.

ටෙන්ඩර් පත්‍ර විවෘත කරන ඉහත කී වේලාවේදී ටෙන්ඩර්කරුවන්ට ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ.

කොළඹ, ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂතැනගෙන් ෆෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුය.

එක් එක් සේවය සම්බන්ධයෙන් රුපියල් 50 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවේ හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ බැඳ ඒ බවට කුවිතාන්සියක් මෙහි ඉදිරිපත් කළ විට ඉහත සඳහන් දිනවලට කලින් දින පෙරවරු 11 වන තෙක් ටෙන්ඩර් ෆෝර්ම කොළ දෙනු ලැබේ.

වැඩි විස්තර රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැක.

එස්. ඒ. පී. රූපසිංහ,
රජයේ සැපයීම් අධ්‍යක්ෂ.

1973 ජූලි මස 20 දින,
කොළඹ දී ය.

7-742—73.07.20 දින අංක 69 දරණ ගැසට් පත්‍රය

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

**විශේෂ නිවේදනයයි**

ශ්‍රී ලංකා ජනරජයේ සතිපතා පළවන ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II අ) සහ (II ආ) වැනි ඡේදයෙහි පළවිය යුතු දැන්වීම් ගැසට් පත්‍රය පළවන සතියට පෙර සතියේ බදාදා දවල් 12.00 ට පෙර රජයේ මුද්‍රණාලයට ලැබිය යුතුයි. ප්‍රමාදවී ලැබෙන දැන්වීම් කුමන හේතුවක් නිසාවත් බාරගනු නොලැබේ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1972 දෙසැම්බර් මස 15 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,

## රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

### අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ කොමසාරිස් වෙත සිංහල හා දෙමළ ඉහළ පන්ති පොත් මුද්‍රණයකර සැපයීම

ඉහළ පන්ති සඳහා—

(අ) සිංහල පොත් 23 ක් හා

(ආ) දෙමළ පොත් 16 ක්

මුද්‍රණය කර සැපයීම සඳහා යාන්ත්‍රික වර්ණයෝජක යන්ත්‍ර (මිකැනිකල් ටයිප් කොම්පෝසිං මැෂිනරි) හෝ ෆොටෝ කොම්පෝසිං යන්ත්‍ර සහිත මුද්‍රණ කරුවන්ගෙන් ටෙන්ඩර් කැඳවනු ලැබේ. මෙම ටෙන්ඩර් පත් 1973 අගෝස්තු මස 25 වැනි දින උදේ 9 ට පෙර සභාපති, ටෙන්ඩර් මණ්ඩලය, ගුවන් විදුලි හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය, නො. 7, ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත, කොළඹ 1. වෙත ලැබෙන්නට සැලැස්විය යුතුය.

2. ටෙන්ඩර් පත් විවෘත කරන අවස්ථාවේ දී පැමිණ සිටීමට ටෙන්ඩර් කරුවන්ට ඉඩ දෙනු ලැබේ. **ඉහත 1 ඡේදයෙහි සඳහන් දිනයේ දී හා වේලාවේ දී, අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති ගේ කාර්යාලයේ දී ඒවා විවෘත කරනු ලබනවා ඇත.**

3. කොළඹ 8, නො. 118, බේස්ලයින් පාරේ, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙන් අයදුම් කර ලබා ගත හැකි ආකෘතීන් මගින් ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ යුතු අතර, **එම ආකෘති පත්‍ර මගින් ඉදිරිපත් නොකරන ලද ටෙන්ඩර් ප්‍රතික්ෂෙප කරනු ලැබේ. මෙම ෆෝර්මවලින් ඉල්ලා ඇති කරුණු සියල්ල සම්පූර්ණ කොට සැපයිය යුතුයි.**

4. ඉහත සඳහන් ආකෘති පත්‍ර, කොන්දේසි හා වෙනත් විස්තර, මිළ ගණන් ඉදිරිපත් කෙරෙන **එක් එක් පොතකට රු. 25 බැගින්** ටෙන්ඩර් තැන්පතුව කළ බවට ලදු පතක් ඉදිරිපත් කිරීමෙන් පසු උදේ 9.30 සිට සවස 2.30 දක්වා කාර්යාල වේලාවන්හි දී ලබා ගත හැකිය.

මෙම මුදල කොළඹ 8, නො. 118, බේස්ලයින් පාරේ, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ තැන්පත් කොට ඉහත සඳහන් ලදු පත ලබා ගත යුතුයි.

5. පොත්වල අත් පිටපත් සෙනසුරාදා හැර, අන් වැඩ කරන දිනයන්හි සාමාන්‍ය කාර්යාල වේලාවන් තුළ, **රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී කලින් වේලාවක් නියම කර ගැනීමෙන් පසු, පරීක්ෂා** කළ හැකිය.

6. සියළුම ටෙන්ඩර් පත් සඳහා පිටපත් දෙකක් ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් පත් එවන කවරයේ වම් පස මුදුනේ **"ඉහළ පංති පොත් මුද්‍රණය කර සැපයීම"** යනුවෙන් සඳහන් විය යුතු අතර, ලාකඩ යොදා සීල් තබා ඉදිරිපත් කළ යුතුය.

7. ටෙන්ඩර් පත්, ලියා පදිංචි කළ තැපැලෙන් එවනු ලැබිය හැකිය. යම් ටෙන්ඩර් කරුවෙක් තම ටෙන්ඩරය මෙසේ එවීමට අදහස් නොකරන්නේ නම්, ඔහුට හෝ ඔහුගේ නියෝජිතයාට, අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිට හෝ ඒවා භාර ගෙන, භාර ගත් බවට දැන්වීමක් නිකුත් කිරීමට බලය පවරනු ලැබ ඇති නිලධාරියාට හෝ, සීල් තබන ලද ටෙන්ඩර් පත් පුද්ගලිකව අතින් භාර දිය හැකිය. (මෙබඳු ටෙන්ඩර් බහාලන ලද කවරයේ ද, ඉහත 6 ඡේදයේ සඳහන් විස්තර සහ ටෙන්ඩර්කරු ගේ නම හා ලිපිනය ද සඳහන් කළ යුතුය.)

8. අවශ්‍ය නම් වැඩි විස්තර, රජයේ මුද්‍රණාලයාධිපති වෙත ලිපියක් එවීමෙන් ලබාගැනීමට පුළුවන.

එල්. ඩබ්. පී. පීරිස්,
රජයේ මුද්‍රණාලයාධිපති.

7–683—73.07.20 දින අංක 69 දරණ ගැසට් පත්‍රය

---

## කොළඹ වරාය කොමිෂන් සභාව

කොළඹ වරාය කොමිෂන් සභා ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා විසින් 1973 අගෝස්තු මස 10 වෙනි සිකුරාදා පස්වරු 2.30 දක්වා ත්‍රිකුණාමලය වරාය සංවර්ධන වැඩ පොළට අඟල් 1½ කැලිගල් කියුබ් 200 ක්, අඟල් ¾ කැලිගල් කියුබ් 200 ක්, අඟල් ½ කැලිගල් කියුබ් 100 ක් සහ ගංගා වැලි කියුබ් 200 ක් සපයා භාරදීම සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ. 1973 අගෝස්තු මස 10 වෙනි දින පස්වරු 2.30 ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර්කරුවන්ට එහි පෙනී සිටින්ට අවසර දෙනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර රිජිස්ටර් තැපැලෙන් නොඑවන අය විසින් ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් ටෙන්ඩර් භාරගැනීම සඳහා බලය පවරන ලද නිලධාරියාට ටෙන්ඩර් පත්‍ර පුද්ගලිකව භාරදී ඒ පිළිබඳව එම නිලධාරියාගෙන් කුවිතාන්සියක් ලබාගත යුතුය. නැතහොත් ටෙන්ඩර්කරුවන්ට තමන්ගේ ටෙන්ඩර් දෙපාර්තමේන්තු ටෙන්ඩර් පෙට්ටියෙහි පුද්ගලිකව තැන්පත් කළ හැක.

3. ටෙන්ඩර් පිළිබඳ ලිපි ලේඛණ කොළඹ වරාය කොමිෂන් සභා කාර්යාලයේ දී පරීක්ෂා කළ හැක. රු. 100 ක මුදලක් වරාය කොමිෂන් සභා කාර්යාලයේ තැන්පත් කර ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට ටෙන්ඩර් ෆෝර්ම කොළ ලබාගත හැක. ටෙන්ඩර් කොන්දේසිවලට අනුව ඇති මුදල ආපසු ගෙවනු ලැබේ.

4. ඉහත සඳහන් අන්දමට ලබාගත් ෆෝර්ම කොළවල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. 1973 අගෝස්තු මස 08 වෙනි දින දවල් 12 දක්වා ටෙන්ඩර් ෆෝර්ම කොළ නිකුත් කරනු ලැබේ.

ඇස්. ඇම්. බී. දොලපිහිල්ල,
වැඩබලන වරාය කොමසාරිස්.

කොළඹ වරාය කොමිෂන් සභාව,
කොළඹ 1.
1973.07.20.

7–663—73.07.20 දින අංක 69 දරණ ගැසට් පත්‍රය

---

## ශ්‍රී ලංකා ගුවන් හමුදාව

### ක්‍රියා විරහිත වාහන විකිණීමේ ටෙන්ඩරය

කොළඹ 2, ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවත, තැ. පෙ. 594, පිහිටි ශ්‍රී ලංකා ගුවන් හමුදා මූලස්ථානයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් කටුනායක ශ්‍රී ලංකා ගුවන් හමුදා කඳවුරේ සැපයීමේ සහ නඩත්තු කිරීමේ ඩිපෝවෙහි ඇති පහත සඳහන් ක්‍රියා විරහිත මෝටර් රථ විකිණීම සඳහා 1973 අගෝස්තු මස 08 වැනි දින පෙරවරු 10 තෙක් මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

(අ) ගුවන් 2031 ෆෝඩ්සන් වෑන්

(ආ) ගුවන් 2035 ෆෝඩ්සන් ට්‍රිලි 800

ටෙන්ඩර් පත් ලබා ගැනීම සඳහා මෙම මූලස්ථානයේ සිවිල් පාලක හා ගණකාධිකාරී වෙත නැවත ලබා ගත හැකි රු. 100 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් ඉදිරිපත් කර රිසිට් පතක් ලබා ගත යුතුයි. 1973 අගෝස්තු මස 07 වැනි දින දහවල් 12 තෙක් ටෙන්ඩර් පත් නිකුත් කරනු ලැබේ.

වැඩි විස්තර කොළඹ 2, ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ පිහිටි ශ්‍රී ලංකා ගුවන් හමුදා මූලස්ථානයෙන් දැන ගත හැක.

පී. එච්. මැන්දිස්,
එයාර් කොමඩෝර්,
ගුවන් හමුදාපති.

7–557/1—73.07.20 දින අංක 69 දරණ ගැසට් පත්‍රය

---

## ශ්‍රී ලංකා ගුවන් හමුදාව

### ග්‍රවුන් ෂීට්ස්/රේන් කෝට්ස් සැපයීමේ ටෙන්ඩරය

කොළඹ 2, ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවත, තැ. පෙ. 594 හි පිහිටි ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් කළු "ආපිහයිඩ්" හම් රෙද්දෙන් මසා නිම කළ "ග්‍රවුන් ෂීට්ස්/රේන් කෝට්ස්" 900 ක් සැපයීම සඳහා 1973 අගෝස්තු මස 08 වැනි දින පෙරවරු 10 තෙක් මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

2. මෙම සැපයීමට අදාල "සැම්පල්" ගුවන් හමුදා මූලස්ථානයේ ටෙන්ඩර් අංශයේ දී පරීක්ෂා කර බැලිය හැක. ටෙන්ඩර් පත් ලබා ගැනීමට ප්‍රථම මෙම මූලස්ථානයේ සිවිල් පාලක හා ගණකාධිකාරී වෙත නැවත ලබා ගත හැකි රු. 100 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් ඉදිරිපත් කර රිසිට් පතක් ලබා ගත යුතුයි. 1973 අගෝස්තු මස 07 වැනි දින දහවල් 12 තෙක් ටෙන්ඩර් පත් නිකුත් කරනු ලැබේ.

3. වැඩි විස්තර කොළඹ 2, ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ පිහිටි ගුවන් හමුදා මූලස්ථානයෙන් දැන ගත හැක.

පී. එච්. මැන්දිස්,
එයාර් කොමඩෝර්,
ගුවන් හමුදාපති.

7–557/2—73.07.20 දින අංක 69 දරණ ගැසට් පත්‍රය

### ශ්‍රී ලංකා ගුවන් හමුදාව

#### අවශ්‍යතාවයනට අමතරව ඇති ටයර් විකිණීමේ ටෙන්ඩරය

කොළඹ 2 ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවත, තැ. පෙ. 594, පිහිටි ශ්‍රී ලංකා ගුවන් හමුදා මූලස්ථානයෙහි ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් පහත සඳහන් අවශ්‍යතාවයනට අමතරව ඇති ටයර් විකිණීම සඳහා 1973 අගෝස්තු මස 08 වැනි දින පෙරවරු 10 තෙක් මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත් භාරගනු ලැබේ :—

ටයර්ස් 1400 × 20—18 ප්ලයි, ස්ටෑන්ඩඩ් ත්‍රෙඩ් = ටයර් 14 යි.

ටෙන්ඩර් පත් ලබා ගැනීමට ප්‍රථම මෙම මූලස්ථානයේ සිවිල් පාලක හා ගණකාධිකාරී වෙත රු. 100 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් ඉදිරිපත් කළ යුතුයි. 1973 අගෝස්තු මස 07 වැනි දින දහවල් 12 තෙක් ටෙන්ඩර් පත් නිකුත් කරනු ලැබේ.

වැඩි විස්තර කොළඹ 2, ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ පිහිටි ශ්‍රී ලංකා ගුවන් හමුදා මූලස්ථානයෙන් දැන ගත හැක.

පී. එච්. මැන්දිස්,
එයාර් කොමඩෝර්,
ගුවන් හමුදාධිපති.

7–557/3—73.07.20 දින අංක 69 දරන ගැසට් පත්‍රය

---

### හෝමාගම තානායම් භාරකරු නිවාසය සහ ගරාජය තැනීම

කොළඹ දිස්ත්‍රික්කයේ හෝමාගම තානායමේ තානායම් භාරකරු නිවාසය සහ ගරාජය තැනීම සඳහා කොන්ත්‍රාත් කරුවෙකු තෝරා ගැනීම පිණිස මා විසින් මුද්‍රා තබනලද ටෙන්ඩර් පත්‍ර 1973 අගෝස්තු මස 10 දින පස්වරු 2 දක්වා බාරගනු ලැබේ. 1973 අගෝස්තු මස 10 දින පස්වරු 2 ට ටෙන්ඩර් පත්‍ර පත්‍ර විවෘත කරනු ලබන අතර එම වේලාවේදී ටෙන්ඩර් ඉල්ලුම්කරුවන්ට තමන් කැමැතිනම් ටෙන්ඩර් මණ්ඩලය ඉදිරියේ පෙනී සිටිය හැක.

2. ටෙන්ඩර්පත් කොළඹ දිසාපතිවෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. නැතහොත් කොළඹ දිසාපති කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුය. ටෙන්ඩර් පත්‍රයේ ඇති සියලුම වෙනස්කිරීම් ටෙන්ඩර්කරු විසින් තමාගේ කෙටි අත්සන යොදා සහතික කළ යුතුය.

3. ටෙන්ඩර් පත්‍ර 1973 අගෝස්තු මස 10 දින දවල් 12 දක්වා කොළඹ දිසාපති කාර්යාලයෙන් ලබාගත හැක. මෙසේ ලබා ගන්නා ලද ටෙන්ඩර් ආකෘතියේ හැර වෙනත් ටෙන්ඩර් ආකෘති වලින් එවන ටෙන්ඩර් බාරගනු නොලැබේ.

4. හෝමාගම තානායමේ තානායම් භාරකරුගේ නිවාසය හා ගරාජය තැනීම වැඩ සඳහා රු. 25 ක් තැන්පත්කොට ලබා ගන්නා ලද කුවිතාන්සි ඉදිරිපත් කිරීමෙන්, ටෙන්ඩර් පත්‍ර ලබාගත හැක. එසේම එවනු ලබන ටෙන්ඩර් පත්‍ර මුද්‍රා තබනලද කවරයක බහා එවිය යුතුයි. එම කවරයේ වම්පස උඩ කොටසේ "හෝමාගම තානායමේ නිවාසයක් තැනීම" යනුවෙන් සඳහන් කළ යුතුයි.

5. තෝරාගත් ටෙන්ඩර්කරු විසින් පිළිගත් ටෙන්ඩරයේ මුළු මුදලින් සියයට 5 ක මුදලක් ඇප වශයෙන් තැන්පත් කළ යුතුයි. එසේම ටෙන්ඩර්කරු විසින් තම ටෙන්ඩරය පිළිගත් බව දන්වා දින හතක් ඇතුළත වැඩ ගිවිසුමක් අත්සන් කිරීමට පැමිණිය යුතුය. එසේ කිරීමට අපොහොසත් වුවහොත් හෝ වැඩ ගිවිසුම අත්සන් කිරීමට ප්‍රතික්ෂේප කළහොත් ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක කරනු ලැබේ.

6. කිසිදු හේතුවක් නොදක්වා ටෙන්ඩර් සියල්ලම හෝ ඕනෑම ටෙන්ඩරයක් ප්‍රතික්ෂේප කිරීමට හෝ ටෙන්ඩරයක කොටසක් පිළිගැනීමට කොළඹ දිසාපතිට හැක.

7. ටෙන්ඩර්පත්‍ර ලබාගත හැක්කේ රුපියල් 40,000 ක කොන්ත්‍රාත් කිරීම සඳහා ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන්ට ඔවුන්ගේ ලියාපදිංචි සහතික ඉදිරිපත් කිරීමෙනි.

8. ලියාපදිංචි සමුපකාර සමිති හා ග්‍රාමසංවර්ධන සමිතිවලට ටෙන්ඩර් පත්‍ර ලබාගැනීමට මුදල් තැන්පත් කිරීම හෝ ඇප මුදල් තැන්පත් කිරීමට හෝ අවශ්‍ය නැත.

9. ටෙන්ඩර්කරුවන් කැමැතිනම් අදාල සැලැස්ම මෙම කාර්යාලයේ දී කාර්යාල වේලාවේදී පරීක්ෂාකර බැලිය හැක. වැඩි විස්තර අවශ්‍ය නම් කොළඹ දිසාපති කාර්යාලයෙන් ලබාගත හැක.

ඩ. වී. ද අල්විස්,
කොළඹ දිසාපති.

1973 ජූලි මස 10 දින,
කොළඹ දිසාපති කාර්යාලයේදීය.

7–662—73.07.20 දින අංක 69 දරන ගැසට් පත්‍රය

---

### කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව

කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ලක්සලට මුද්‍රිත කඩදාසි ඇසුරුම් මලු සැපයීම සඳහා කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1973. 08. 09 දින පෙ. ව. 10 දක්වා ටෙන්ඩර් බාරගනු ලැබේ.

2. මේ සඳහා ඉදිරිපත්වන ටෙන්ඩර්කරුවන් විසින් රු. 25 ක මුදලක් ටෙන්ඩර් තැන්පත් වශයෙන් තැන්පත් කොට මෙම කාර්යාලයෙන් ලබාගත් කුවිතාන්සියක් 1973. 08. 08 දින දවල් 12 ට පෙර ඉදිරිපත් කිරීමෙන් ටෙන්ඩර් පත් ලබාගත හැක.

සෝමපාල ගුණධීර,
කුඩා කර්මාන්ත අධ්‍යක්ෂ.

යොමු අංකය : 3/1—(5/31).
කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව,
හේමාස් ගොඩනැගිල්ල,
කොළඹ 1,
1973 ජූලි මස 09 වැනි දින.

7–637—73.07.20 දින අංක 69 දරන ගැසට් පත්‍රය

---

### ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව

දුම්රිය මැදිරි 140 ක් සැපයීම සඳහා එවනු ලබන ටෙන්ඩර් පත්‍ර ප්‍රවාහන අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩල සභාපතිතැන විසින් (ලිපිනය : ප්‍රවාහන අමාත්‍යාංශය, කොළඹ 1) 1973 ඔක්තෝබර් මස 24 වැනි බදාදා දින පෙ. ව. 11 වන තෙක් භාර ගනු ලැබේ.

2. ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කිරීමට පළමු ටෙන්ඩර්කරු විසින් ඉහත සඳහන් සේවාව භාර ගැනීමට සහ හරියාකාරව ඉටු කිරීමට තමාගේ මුදල් තත්ත්වය ප්‍රමාණවත් බව ඔප්පු කිරීමට, ඒ සම්බන්ධයෙන් ලියකියවිලි ඉදිරිපත් කළ යුතුය.

3. මරදානේ දුම්රිය ගබඩා අධිකාරීතැනගේ කාර්යාලයෙන් (තැ. පෙ. අංක 1347, කොළඹ 10) පිටපත් තුනක් බැගින් ලබාගත හැකි ෆෝර්ම කොළවල ටෙන්ඩරය ලියා පිටපත් තුනක් සහිතව එවිය යුතුය.

4. ටෙන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් රු. 1,000 ක් (මෙම මුදලට ආපසු ගෙවනු නොලබන රු. 200 මුදලක් ඇතුලත්වේ.) මරදානේ දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරීතැනගේ කාර්යාලයේ හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කර ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට 1973 ඔක්තෝබර් මස 20 වැනි සෙනසුරාදා දහවල් 12 දක්වා ටෙන්ඩර් ෆෝර්ම කොළ නිකුත් කරනු ලැබේ.

5. 1973 ඔක්තෝබර් මස 24 වැනි බදාදා පෙ. ව. 11.05ට ප්‍රවාහන අමාත්‍යාංශයේ කාර්යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට, ටෙන්ඩර්කරුවන්ට පෙනී සිටීමට අවසර ඇත.

6. වැඩි විස්තර මරදානේ දුම්රිය ගබඩා අධිකාරීතැනගේ කාර්යාලයෙන් ලබාගත හැක.

බී. ඊ. නවරත්න,
දුම්රිය සාමාන්‍යාධිකාරී.

1973 ජූලි 20 දින,
කොළඹ දීය.

7–651—73.07.20 දින අංක 69 දරන ගැසට් පත්‍රය

දින සිට දින 4 ක් ඇතුළත යම් ටෙන්ඩර්කරුවෙකුට එවැනි දැන්වීමක් නොලැබුනහොත් ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන ගෙන් ඒ ගැන කරුණු විමසිය යුතුය.

7. ටෙන්ඩර්කරුට උවමනා නම් ටෙන්ඩර් විවෘත කරන වේලාවේදී ඉදිරියේ පෙනී සිටීමට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් භාරගැනීම නැවැත්වීමට නියමිත දින එකී වේලාවේදී පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේදී ඒවා විවෘතකරනු ලැබේ.

8. නියමිත පෝර්මයේ ලියා නැති නැතහොත් එකී නියමිත කොන්දේසි සම්පූර්ණ වශයෙන් ඉටුවී නැති කිසිම ටෙන්ඩර් පත්‍රයක් ටෙන්ඩර් පත්‍රයක් ලෙස සලකනු නොලැබේ. ටෙන්ඩර් ප්‍රමාණයන් සහ ගණන් පැහැදිලි ලෙස තීන්තෙන් ලකුණු කළයුතුවාත් හැර ඒවා සම්බන්ධයෙන් යම්කිසි වෙනසක් කළහොත් ඒ තැන්වල ටෙන්ඩර් කරුගේ කෙටි අත්සන තැබිය යුතුවේ.

9. ටෙන්ඩර් පත්‍රයේ සඳහන්වූ මුළු ගණනින් සියයට 5 ක ඇප මුදලක් තැන්පත් කිරීමටත් ගිවිසුම් පත්‍රයක් අත්සන් කිරීමටත් පත්කරනු ලැබූ ටෙන්ඩර්කරුට නියම කරනු ලැබේ. මේ මුදල ආපසු දෙනු ලබන්නේ කොන්ත්‍රාත්තුව නිසි පරිදි ඉටුකර නිමවූවාට පසුවය. පත්කරනු ලැබූ ටෙන්ඩර්කරු මේ කොන්ත්‍රාත්තුව ඉටු නොකළහොත් ඔහුගේ ඇප මුදල රාජසන්තක වනවා පමණක් නොව ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන් ගේ ලැයිස්තුවට ඇතුළත්වෙනවා ඇත.

10. ගිවිසුම් පත්‍රවලට ඇලවිය යුතු මුද්දරවල වටිනාකම පත්කරනු ලැබූ ටෙන්ඩර්කරු විසින් ගෙවිය යුතුය.

11. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ලිපිනයන් පැහැදිලි අකුරින් ටෙන්ඩර් පත්‍රයේ ලිවිය යුතුය.

12. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් සියලුම මිළ ගණන් යටත්පිරිසෙයින් සති 21 කටවත් වෙනස් නොවන ඒවා විය යුතුය.

13. යම්කිසි ටෙන්ඩර් පත්‍රයක් හෝ සියලුම ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂේප කිරීමත් හෝ ටෙන්ඩර් පත්‍රයක යම්කිසි කොටසක් පිළිගැනීමේ හෝ බලය කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙත තබාගනු ඇත.

14. වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ ආණ්ඩුවේ ලැයිස්තුවට තනි තනිව හෝ එම ලැයිස්තුවේ නම සඳහන් වන කෙනෙකුගේ නම සමඟ නම ඇතුළත්ව හෝ ටෙන්ඩර් මණ්ඩලයට සැහේයයි පෙනියන හේතුන් පිට ටෙන්ඩර් මණ්ඩලය විසින් එකඟ නොවන කිසිවකු සමඟ කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නොලැබේ.

15. කොන්ත්‍රාත්කරුට භාරදියයුතු සියලුම දැන්වීම් ඔහුගේ අතට දුනහොත් හෝ ඔහු විසින් සඳහන් කර ඇති ලිපිනයට තැපෑලෙන් යැව්වොත් හෝ ඔහුගේම අතට භාර දුන්නාසේ සලකනු ලැබේ.

16. කොන්ත්‍රාත්තුව යටතේ වැඩ කරවා ගැනීමට පුහුණු හා නුපුහුණු ලාංකික දෙවර්ගයේම කම්කරුවන් පමණක් තෝරාගනු ලබන ටෙන්ඩර්කරු විසින් නියුක්ත කළ යුතුයි. ඒ කම්කරුවන් හැකි තරම් දුරට බඳවා ගත යුත්තේ වැඩ කරන ප්‍රදේශයේ සිටින අය අතුරෙනි. කොන්ත්‍රාත්තුවේ කොන්දේසි සපුරාලීමට ටෙන්ඩර්කරු යම්කිසි විධියකින් අසමත් වුවහොත් කොන්ත්‍රාත්තුව අවලංගු වීමට එය තුඩුදෙනවා ඇත. එහෙත් කෘෂිකර්ම අධ්‍යක්ෂ විසින් විශේෂ අවස්ථාවලදී කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්වරයාගේ එකගත්වය ඇතිව නිශ්චිත ලියවිල්ලකින් එකී නිලධාරි විසින් අනුමත කරන ලද ලාංකික නොවන කම්කරුවන් නියුක්ත කරවීමට ටෙන්ඩර්කරුට බලය දියහැක. එවැනි ලිඛිත බලයක් හා එකඟතාවයක් නොමැතිව ලාංකික නොවන කම්කරුවන් යෙදවීම තහනම්වන අතර ඒ කොන්ත්‍රාත්තුව කඩකිරීමක් සේ සලකනු ලැබේ. ලාංකික යන්නෙන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කිරීමෙන් හෝ ලංකාවේ රටවැසියෙකු අදහස් කරන අතර එවැනි අය එකී පාඨයට ඇතුළත් වෙයි. කොන්ත්‍රාත්තුවේ යොදවනු ලබන සෑම කම්කරු කොට්ඨාශයක ටම සාධාරණවූද කම්කරු ගෙවීම් සම්බන්ධයෙන් දැනට බලපවත්වන මින්මතු ක්‍රියාත්මක වියහැකි සියලුම රෙගුලාසිවලට අනුකූලවූද වේතනයක් ගෙවීට ටෙන්ඩර්කරු එකඟ විය යුතුය. කොන්ත්‍රාත්තුවේ වැඩ කෙරෙහි යොදවනු ලැබූ කම්කරුවන් හා සම්බන්ධ ඔවුන්ගේ වනගොන චෙක්රෝල් පොත්, පේරෙට්ටු පොත් සහ අනිකුත් ලිපි ලේඛනද පරීක්ෂාකර බැලීමට කෘෂිකර්ම අධ්‍යක්ෂ විසින් විධිමත්ව බලය දෙනු ලැබූ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ඕනෑම නිලධාරියෙකුට ඒවා පරීක්ෂා කිරීමට ඉඩදීමට තෝරාගත් ටෙන්ඩර්කරු බැඳී සිටිය යුතුය.

17. 1934 අංක 19 දරණ කම්කරු වන්දි ආඥාපනත (අධිකාරය 117) යටතේ සේවකයකු විසින් හෝ සේවකයෙකු සම්බන්ධයෙන් ඉදිරිපත් කෙරෙන කවර වන්දියක් සම්බන්ධයෙන් වුවද රජය නිදහස් කිරීමට කොන්ත්‍රාත්කරු වග බලාගත යුතුය.

18. තැපෑලෙන් ටෙන්ඩර් ආකෘති පත්‍ර ඉල්ලා කුවිතාන්සි එවන අයට ඒ දිනයේදීම ටෙන්ඩර් ආකෘති පත්‍ර ලියාපදිංචි තැපෑලෙන් එවනු ලැබේ. එහෙත් ඒවා කලට වේලාවට ඔවුන්ට නොලැබුන හොත් ඒවා ගැන වගකියනු නොලැබේ.

19. මේ පිළිබඳ වැඩි විස්තර ගොවිපල් අධිකාරිගෙන් ලබාගත හැකිය.

ජේ. යූ. නානායක්කාර.
නියෝජ්‍ය අධ්‍යක්ෂ, කෘෂිකර්ම ගොවිපල්.

1973.07.08 වැනි දින.
පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ දී ය.

7-681 —73.07.20 දින අංක 69 දරණ ගැසට් පත්‍රය

---

## ප්‍රාදේශීය සිවිල් ඉංජිනේරු සංවිධානය — උතුරු දිසාව

වවුනියාව උතුරු දිසා වැඩ අධ්‍යක්ෂ කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් පහත සඳහන් වැඩය සඳහා ටෙන්ඩර් පත්, 1973 අගෝස්තු මස 7 වැනි දින පෙරවරු 10 දක්වා බාරගෙන, එම වේලාව ගත වූ වහාම එම ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ :—

"තොන්ඩමනාරු හරස් අමුණට ලී ගේට්ටු දෙකක් සැපයීම සහ සවිකිරීම"

2. රුපියල් 40,000 ට හෝ ඊට වැඩි මුදලකට වාරිමාර්ග, මහා මාර්ග, ගොඩනැගිලි, ප්‍රාදේශීය සිවිල් ඉංජිනේරු සංවිධානයේ ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවනට හා පිළිගත් ව්‍යාපාර ආයතනයන්ට මෙම වැඩය සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කළ හැකිය. ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන අය එසේ ලියාපදිංචි වී ඇති බව සනාථ කිරීමට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. ඔවුන් දැනට කරන මෙම දෙපාර්තමේන්තුව සම්බන්ධ වැඩ හා ඒවායේ වටිනාකම පිළිබඳ ප්‍රකාශයන් පේදුරුතුඩුව විධායක ඉංජිනේරු තැන වෙත ඉරිදිපත් කළ යුතුය.

3. 1973 අගෝස්තු 3 වෙනි දින ප. ව. 2 දක්වා පේදුරුතුඩුව විධායක ඉංජිනේරු කාර්යාලයෙන් ලබාගත හැකි ටෙන්ඩර් පත්‍රවල පිටපත් දෙකකින් යුක්තව ටෙන්ඩරය ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලබන්නේ රු. 50 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් පේදුරුතුඩුව විධායක ඉංජිනේරු තැනට ගෙවූ විට හෝ රු. 50 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් මෙම කාර්යාලයට හෝ ඕනෑම දිසාපති කාර්යාලයකට ගෙවා, ඒ වෙනුවෙන් ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට පමණි.

4. ටෙන්ඩර් පත්‍ර පිටපත් දෙකකින් යුක්තව, වවුනියාව උතුරු දිසා වැඩ අධ්‍යක්ෂ කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ටෙන්ඩර් පත්‍ර බහා එවන කවරයේ සීල් තබා තිබිය යුතු අතර, වැඩයේ විස්තරය එම කවරයේ වම් පස ඉහළ කෙළවරේ සඳහන් කර තිබිය යුතුය.

5. මෙම වැඩ පිළිබඳ සැලසුම් හා අනිකුත් සියළු තොරතුරු, පේදුරුතුඩුව විධායක ඉංජිනේරු කාර්යාලයේ කාර්යාල වේලාවන් තුළ දී ලබාගත හැකිය.

එස්. ත්‍යාගරාජා,
විධායක ඉංජිනේරු තැන,
පේදුරුතුඩුව.

විධායක ඉංජිනේරු කාර්යාලය,
ප්‍රා. සි. ඉ. සං.,
පේදුරුතුඩුව.

7—657—73.07.20 දින අංක 69 දරණ ගැසට් පත්‍රය

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### හිස් ගෝනි 10,000 ක් විකිණීම

පහත සඳහන් වර්ගයේ හිස් ගෝනි තොගය විකිණීම සඳහා කොළඹ 5, නාරාහේන්පිට, කෘෂිකර්ම මධ්‍යම ගබඩාවේ කෘෂිකර්ම නිලධාරී (සැපයීම්) විසින් 1973 අගෝස්තු මස 22 දින පෙ. ව. 10 දක්වා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ. ටෙන්ඩර් එදිනම පෙ. ව. 10.15 ට විවෘත කරන විට ටෙන්ඩර්කරුවන්ට පෙනී සිටීමට ඉඩදෙනු ලැබේ.

නො. 1 පාවිච්චි කළ හිස් ගෝනි 10,000 යි.

ටෙන්ඩර් පත්‍ර නියමිත ආකෘති පත්‍රවල ලියා ඉදිරිපත් කළ යුතුය. එක් එක් ටෙන්ඩර් වෙනුවෙන් රු. 25 ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් ටෙන්ඩර් ආකෘතිපත්‍ර 1973 අගෝස්තු මස 20 වැනි දින ප. ව. 3 දක්වා මෙම කාර්යාලයෙන් ලබාගත හැක. ඕනෑම කච්චේරියක හෝ පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ හෝ මෙම ටෙන්ඩර් ගාස්තු තැන්පත් කළ හැකිය.

1973 අගෝස්තු මස 22 දින පෙ. ව. 10 ට පෙර මාවෙත ලැබෙන සේ ටෙන්ඩර් පත් ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. එහෙත් ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ ටෙන්ඩර් එසේ ලියාපදිංචි කළ තැපෑලෙන් එවීමට කැමති නොවන්නේ නම් ඔවුන්ට හෝ ඔවුන්ගේ නියෝජිතයින්ට හෝ මුද්‍රා තබන ලද්දාවූ කවරය සහිත ටෙන්ඩරය මෙම කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ හැක.

ටෙන්ඩර් බහා එවන කවරය මුද්‍රා තැබිය යුතු අතර, කවරයේ වම් පස උඩ කෙළවරේ "හිස් ගෝනි සඳහා වූ ටෙන්ඩරය" යනුවෙන් සඳහන් කළ යුතුය.

කාර්යාලීය වේලාවන් තුළදී මෙම හිස් ගෝනි තොගය පරීක්ෂාකර බැලීමට අවසර දෙනු ලැබේ.

වැඩි විස්තර මෙම කාර්යාලයෙන් විමසා දැනගත හැක.

එල්. එච්. එස්. පෙරේරා,
කෘෂිකර්ම නිලධාරී (සැපයීම්).

1973 ජූලි මස 07 වැනි දින,
නාරාහේන්පිට,
කෘෂිකර්ම මධ්‍යම ගබඩා කාර්යාලයේදී ය.

7–638 –73.07.20 දින අංක 69 දරණ ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### ගොඩනැගිලි ඉදිකිරීම

පේරාදෙණිය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් පහත සඳහන් ගොඩනැගිලි ඉදිකිරීම සඳහා 1973 අගෝස්තු මස 10 දින ප. ව. 2 දක්වා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

2. පේරාදෙණිය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සිවිල් ඉංජිනේරු අංශයේ අධිකාරී ඉංජිනේරු (ගොඩනැගිලි) තැනගෙන් ලබාගත හැකි ටෙන්ඩර් ආකෘති පත්‍ර පිටපත් දෙකකින් යුක්තව පිළිගෙල කර ඉදිරිපත් කළ යුතුය. ඔහුගෙන් රූප සටහන්, විශේෂ විස්තර හා වෙනත් තොරතුරු ලබාගත හැකිය.

3. මේ සඳහා ටෙන්ඩර් කළ හැක්කේ රජයේ සෑම දෙපාර්තමේන්තුවකම කොන්ත්‍රාත් ක්‍රියාත්මක කිරීම සඳහා රු. 70,000 කට වැඩි වටිනාකමකින් යුත් ලියාපදිංචි, හා මාස 4කින් නිමකිරීම සඳහා ගොඩනැගිලි ද්‍රව්‍ය, කම්කරුවන්, ඉතා පහසුවෙන් ලබාගත හැකි කොන්ත්‍රාත්කරුවන්ටය. කෘෂිකර්ම අධ්‍යක්ෂ සතුටුදායක ලෙස නියමිත කාලය තුල ගොඩනැගිලි නිමකිරීමට නොහැකි කොන්ත්‍රාත්කරුවන් ටෙන්ඩර් කළ යුතු නොවේ.

බීට—7308 ව්‍යාප්ති මධ්‍යස්ථානය, රාජාංගනය

බීට—7309 ව්‍යාප්ති මධ්‍යස්ථානය, කන්දලම

බීට—7310 ව්‍යාප්ති මධ්‍යස්ථානය, කන්තලේ

බීට—7311 ව්‍යාප්ති මධ්‍යස්ථානය, කාගම කට්ටියාව

බීට—7312 ව්‍යාප්ති මධ්‍යස්ථානය, මින්නේරිය

4. (අ) 3 වැනි ඡේදයේ සඳහන් ලියාපදිංචි කිරීමේ ලියකියවිලිද,

(ආ) රු. 50ක ටෙන්ඩර් තැන්පත් මුදල් කුවිතාන්සියක්ද, ඉදිරිපත් කළ විට 1973 අගෝස්තු මස 9 දින ප. ව. 2.30 දක්වා ටෙන්ඩර් ආකෘති පත් නිකුත් කරනු ලැබේ.

5. ටෙන්ඩර් තැන්පත් මුදල් පේරාදෙනියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හෝ කච්චේරියක හෝ කෘෂිකර්ම අධ්‍යක්ෂකගේ අංක 37 ගිණුමට බැර කරමින් කොළඹ යෝක් වීදියේ ලංකා බැංකු ශාඛාවේ හෝ තැන්පත් කළ යුතුය.

ඇල්. ඇස්. ඇස්. ජයසුන්දර,
කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙනුවට.

1973 ජූලි මස 06 දින,
පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ
සිවිල් ඉංජිනේරු අංශයේ දී ය.

7-753/1—73.07.20 දින අංක 69 දරණ ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### ගොඩනැගිලි ද්‍රව්‍ය සඳහා මිල ගණන් කැඳවීම

පහත සඳහන් ගොඩනැගිලි ද්‍රව්‍ය සැපයීම සඳහා 1973 අගෝස්තු මස 10 දින ප. ව. 2 දක්වා පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සිවිල් ඉංජිනේරු අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ටෙන්ඩර් කැඳවනු ලැබේ :—

(1) හොඳින් පුළුස්සන ලද මධ්‍යම ප්‍රමාණයේ හොඳ වගීයේ ගඩොල් 1,000 බැගින්

(2) අපවිත්‍ර ද්‍රව්‍යයන්ගෙන් තොර හොඳ වර්ගයේ ගංගා වැලි කියුබ් එක බැගින්

(3) අපවිත්‍ර ද්‍රව්‍යයන්ගෙන් තොර හොඳ වර්ගයේ $\frac{3}{4}$" සහ $1\frac{1}{2}$" කැට ගල් කියුබ් එක බැගින්

(4) අපවිත්‍ර ද්‍රව්‍යයන්ගෙන් තොර හොඳ වගීයේ තම්බන ලද හුනු බුසල බැගින්.

(5) අපවිත්‍ර ද්‍රව්‍යයන්ගෙන් තොර හොඳ වගීයේ අළුහුනු බුසල බැගින්.

(6) වියන ලද හොඳ වර්ගයේ ඉරු දෙකේ පොල්තුක 1,000 බැගින්

මෙම ද්‍රව්‍යයන් පහත සඳහන් ස්ථානවලට ගෙනවිත් භාරදිය යුතු සහ රජයේ වාහනවලට පටවා දිය යුතු මිල ගණන් වෙන වෙනම සඳහන් කර එවිය යුතුය :—

(1) රාජාංගන ගොඩනැගිලි වැඩබිම
(2) කන්දලම ගොඩනැගිලි වැඩබිම
(3) කන්තලේ ගොඩනැගිලි වැඩබිම
(4) කාගම කට්ටියාව ගොඩනැගිලි වැඩබිම
(5) මින්නේරිය ගොඩනැගිලි වැඩබිම

2. මෙම සියලු ද්‍රව්‍යයන් ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ අංක 182හි සංශෝධනය අනුව ගොඩනැගිලි සඳහා අනුමත කරණ ලද නියම තත්ත්වයේ ඒවා විය යුතුය.

3. මෙම එක් එක් ගොඩනැගිලි ද්‍රව්‍යකට හෝ කොටසකට හෝ සියල්ලටම හෝ ටෙන්ඩර් කළ හැකිය.

4. එක් එක් ගොඩනැගිලි වැඩ බිම සඳහා වෙන වෙනම ටෙන්ඩර් ආකෘතිපත් පිටපත් දෙකකින් යුතුව පිළිගෙල කොට ටෙන්ඩර් බහාලන ලියුම් කවරයේ "ගොඩනැගිලි ද්‍රව්‍ය සඳහා මිල ගණන්" යන්න සඳහන් කොට සියලුම ටෙන්ඩර් අත්සන් තබා සීල්කර සුරක්ෂිතව ලේඛණගත තැපෑලෙන් 1973 අගෝස්තු මස 10 දින ප. ව. 2 ට පෙර "සභාපති, ප්‍රදේශීය ටෙන්ඩර් මණ්ඩලය, සිවිල් ඉංජිනේරු අංශය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පේරාදෙනිය" යන ලිපිනයට එවිය යුතුය.

5. සියලුම ටෙන්ඩර් අනුමත කරණ ලද දිනයේ සිට දින 40ක කාලයක් තුල භාරගැනීම් සඳහා වලංගු විය යුතුය.

6. ටෙන්ඩර් සියල්ල හෝ කොටසක් හෝ එකක් හෝ භාර ගැනීමට හෝ ප්‍රතික්ෂෙප කිරීමේ සම්පූර්ණ බලය රජය සතුය.

7. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර පේරාදෙනියේ අධිකාරී ඉංජිනේරු (ගොඩනැගිලි) තැනගෙන් අසා දැනගත හැකිය.

ඇල්. ඇස්. ඇස්. ජයසුන්දර,
කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙනුවට.

1973 ජූලි මස 06 දින,
පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ,
සිවිල් ඉංජිනේරු අංශයේ දී ය.

7-753/2—73.07.20 දින අංක 69 දරණ ගැසට් පත්‍රය

සම්බන්ධයෙන් දැනට බල පවත්වන සහ මින් මතු ක්‍රියාත්මක විය හැකි සියළුම රෙගුලාසිවලට අනුකූලවූද වේතනයන් ගෙවීමට කොන්ත්‍රාත්කරු එකඟ විය යුතුයි.

කොන්ත්‍රාත්කරු විසින් එකී වැඩ කෙරෙහි යොදවනු ලැබූ කම්කරුවන් හා සම්බන්ධ ඔහුගේ පත පොත, චැක්රෝල් පොත්, පෙරෙට්ටු පොත් සහ අනිකුත් ලිපි ලේඛන පරීක්‍ෂාකර බැලීමට කෘෂිකර්ම අධ්‍යක්‍ෂ විසින් විධිමත්ව බලය දෙනු ලැබූ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ඕනෑම නිලධාරියෙකුට ඒවා පරීක්ෂා කිරීමට ඉඩ දීමට කොන්ත්‍රාත්කරු බැඳී සිටී.

14. පෞද්ගලිකව ටෙන්ඩර්කරු වෙත භාරදෙන ලද හෝ ටෙන්ඩර් පත්‍රයේ සඳහන් ලිපිනයට ලියාපදිංචි කළ තැපෑලෙන් යවන ලද හෝ ටෙන්ඩරයට අදාල සෑම දැන්වීමක්ම ටෙන්ඩර්කරු අතට පත් කලාසේ සළකනු ලැබේ.

15. 1934 වර්ෂයේ අංක 19 දරණ කම්කරු ආඥාපණතේ (117 වන අධිකාරිය) යටතේ සේවයේ යොදන ලද කම්කරුවෙකු විසින් හෝ කම්කරුවෙකු වෙනුවෙන් ඉල්වනු ලබන වන්දියකින් කොන්ත්‍රාත්කරු විසින් රජය නිදහස් කළ යුතුයි.

16. ටෙන්ඩර්කරු විසින් වැඩට ගන්නා යම් සේවකයෙකු සේවයේ යෙදවීම අහිතකර දෙයක් ලෙස සළකා ඊට විරෝධය දැක්වීමේත්, යම් සේවකයෙකු සේවයේ යෙදවීමට කලින් විරුද්ධවීමේත් බලය රජය සතු වන්නේ ය.

17. වැඩ පැහැර හරින කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ රජය මගින් තබා ඇති ලේඛණයේ තනි තනිව හෝ ලේඛණයේ නම් සඳහන් වෙනත් අයෙකුගේ නම සමග හෝ ඇතුළු වී සිටින යම් පුද්ගලයෙකු සමග හෝ කෘෂිකර්ම අධ්‍යක්‍ෂ වරයාට හැඟී යන හේතු නිසා හෝ කොන්ත්‍රාත්තුව භාරදීම නුසුදුස්සෙකු ලෙස සලකා ඔහු විසින් විරෝධය දක්වන කිසිවෙකු සමග කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නොලැබේ.

18. මේ පිළිබඳ වැඩි විස්තර බතලගොඩ රජයේ ගොවිපලේ කළමනාකාර තැනගෙන් දැනගත හැකිය.

හේ. යූ. නානායක්කාර,
නියෝජ්‍ය අධ්‍යක්‍ෂ (ගොවිපල්).

1973 ජූලි 03 වන දින,
පේරාදෙණියේ දීය.

7-528 —73.07.20 දින අංක 69 දරණ ගැසට් පත්‍රය

---

## ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

බදුල්ල දිස්ත්‍රික්කයේ පහත සඳහන් වැඩ සඳහා 1973 අගෝස්තු මස 20 වැනි දින පස්වරු 2.30 දක්වා බදුල්ල දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ සහකාර ඒජන්ත විසින් ටෙන්ඩර් පත් භාර ගනු ලැබේ.

| වැඩෙහි ස්වභාවය | ලියාපදිංචි විය යුතු මුදල රුපියල් |
|---|---|
| (1) වැලිමඩ ප්‍රා. ආ. නි. කොට්ඨාශයේ, මීරහවත්ත ඉ. ක. ඕ. නිවාසය අළුත්වැඩියා කිරීම හා ළිඳක් තැනීම ... ... | 5,000 |
| (2) බදුල්ල ප්‍රා. ආ. නි. කොට්ඨශයේ, ආගරගම-යෙල්වර්ටන් පාරේ පැති බැමි දෙකක් තැනීම ... | 4,500 |
| (3) බදුල්ල ප්‍රා. ආ. නි. කොට්ඨාශයේ හඳුගහපතාන පාර වැඩි දියුණු කිරීම ... | 3,000 |

2. ඉහත සඳහන් වැඩ ඉදිරියෙන් සඳහන් කර ඇති ප්‍රමාණයට හෝ ඊට වැඩි ගණනකට රජයේ දෙපාර්තමේන්තුවල කොන්ත්‍රාත්කරුවන් වශයෙන් ලියා පදිංචි වී ඇති අනුමත ග්‍රාම සංවර්ධන සමිති, කම්කරු සමිති හා සමූපකාර සමිතිවලට සහ පෞද්ගලික කොන්ත්‍රාත්කරුවන්ට 1973 අගෝස්තු මස 15 වැනි දින පස්වරු 2.30 තෙක් බදුල්ලේ කච්චේරියේ දී ටෙන්ඩර් පෝරම නිකුත් කරනු ලැබේ.

3. ටෙන්ඩර් පෝර්ම අපේක්‍ෂකයින් විසින් බදුල්ල කච්චේරියේ හෝ වෙනත් ඕනෑම කච්චේරියක හෝ අදළ වැඩය වෙනුවෙන් රු. 25 ක මුදලක් තැන්පත් කොට ලබා ගත් කුවිතාන්සියක් බදුල්ලේ දිසාපති වෙත ඉදිරිපත් කළ විට, ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ. ග්‍රාම සංවර්ධන සමිති, කම්කරු සමිති හා සමූපකාර සමිති ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීමට මුදල් තැන්පත් කිරීම අනවශ්‍යය. චෙක්පත්, මුදල් ඇණවුම්, තැපැල් ඇණවුම් ආදිය භාර ගනු නොලැබේ.

4. ටෙන්ඩර් පෝර්ම සම්පූර්ණ කර, පිටපත් දෙකකින් යුක්තව ලේඛනගත තැපෑලෙන් එවිය යුතුයි. ටෙන්ඩර් බහා එවන කවරයට මුද්‍රා තැබිය යුතු අතර, කවරයේ උඩ වම් කෙළවරේ වැඩෙහි නම ලියා තිබිය යුතුය. ටෙන්ඩර් පෝර්ම තැපෑලෙන් නොඑවන්නේ නම්, බදුල්ල කච්චේරියේ ඉඩම් අංශයේ, ආණ්ඩුවේ සහකාර ඒජන්තගේ කාමරයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුය.

5. 1973 අගෝස්තු මස 20 වැනි දින පස්වරු 2.30 ට ඉහත කී ආණ්ඩුවේ සහකාර ඒජන්තගේ දරණ කාමරයේ දී ටෙන්ඩර් පෝර්ම විවෘත කරනු ලැබේ.

6. තමාගේ ටෙන්ඩර් පත්‍රය භාරගත් බවට ලිපියක් හෝ දැන්වීමක් ලත් පසු, යම් අයෙක් ගිවිසුම් පත් අත්සන් කිරීමට හෝ ඇප තැබීමට හෝ දින 10 ක් ඇතුළත අපොහොසත් වුවහොත්, ඔහු විසින් ටෙන්ඩර් පෝර්ම සඳහා තැන්පත් කරන ලද මුදල රාජසන්තක කරනු ලැබේ. ලියා පදිංචි වූ කම්කරු සමිති, විවිධ සේවා සමූපකාර සමිති හා ග්‍රාම සංවර්ධන සමිති ඇප තැබීමෙන් නිදහස් ය.

7. තෝරා ගනු ලබන ටෙන්ඩර්කරු විසින් සපයන ලද ලිපිනයට ලියා පදිංචි තැපෑලෙන් ටෙන්ඩර් භාරගත් බවට දැන්වීමක් හෝ වෙනයම් අන්දමකින් එම ලිපිනයට ඒ බව දන්වීම ටෙන්ඩර්කරුට එය ලැබුණාක් මෙන් සලකනු ලැබේ.

8. මේ කොන්ත්‍රාත්තුව යටතේ වූ වැඩය කරවා ගැනීමට, පුහුණු නුපුහුණු යන දෙවර්ගයේම ලාංකික කම්කරුවන් පමණක් යෙදවීමට කොන්ත්‍රාත්කරු මෙයින් එකඟ වන අතර, ඔව්හු පමණක් එසේ නියුක්ත කරනු ලබන්නාහ. ඒ කම්කරුවන් හැකි තරම් දුරට බඳවා ගත යුත්තේ වැඩය කෙරෙන ප්‍රදේශයේ සිටින අය අතුරිනි.

9. කොන්ත්‍රාත්තුවේ මේ කොන්දේසිය සපුරාලීමට කොන්ත්‍රාත්කරුවා යම් විධියකින් අසමත් වුවහොත්, කොන්ත්‍රාත්තුව අවලංගු වීමට එය තුඩුදෙනවා ඇත. එහෙත්, කොන්ත්‍රාත්තුවට එළඹෙන ලද නිලධාරියා විසින් විශේෂ අවස්ථාවල දී කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ එකඟත්වය උඩ නිශ්චිතව, ලියවිල්ලකින් එකී නිලධාරියා විසින් අනුමත කරන ලද ලාංකික නොවන කම්කරුවන් නියුක්ත කරවීමට කොන්ත්‍රාත්කරුට බලය දිය හැකිය.

10. එවැනි ලිඛිත බලයක් හා එකඟත්වයක් නොමැතිව ලාංකික නොවන කම්කරුවන් යෙදවීමට තහනම් වන අතර, එකී කොන්ත්‍රාත්තුව කඩ කිරීමක් ලෙස සලකනු ලැබේ.

11. මේ කොන්ත්‍රාත්තුවේ අභිප්‍රාය සඳහා "ලාංකික" යන්නෙන්, පරම්පරාවෙන් හෝ ලියා පදිංචි කිරීමෙන් හෝ ශ්‍රී ලංකාවේ රටවැසියෙකු ලෙස අදහස් කෙරෙන අතර, එවැන්නෙක් එකී පාඨයට ඇතුළත් වෙයි.

12. මේ කොන්ත්‍රාත්තුවේ කටයුතු සඳහා යොදවනු ලබන සෑම කම්කරු කොට්ඨාශයකටම සාධාරණ වූ ද, කම්කරුවන්ට වේතන ගෙවීම සම්බන්ධයෙන් දැනට බලපවත්වන සහ මින්මතු ක්‍රියාත්මක විය හැකි සියළුම රෙගුලාසිවලට අනුකූලවූ ද, වේතන ගෙවීමට කොන්ත්‍රාත්කරු මෙයින් එකඟ වෙයි.

13. කොන්ත්‍රාත්කරු විසින් එකී වැඩ කෙරෙහි යොදවනු ලැබූ කම්කරුවන් හා සම්බන්ධ ඔහුගේ පතපොත පෙරෙට්ටු පොත් හා අනිකුත් ලිපි ලේඛන පරීක්ෂා කර බැලීමට ඉඩම් කොමසාරිස් විසින් විධිමත් බලය දෙනු ලැබූ ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ඕනෑම නිලධාරියෙකුට ඒවා පරීක්ෂා කිරීමට ඉඩදීමට කොන්ත්‍රාත්කරු බැඳී සිටී.

14. ටෙන්ඩර්කරුවන්ට අවශ්‍ය වෙනත් තොරතුරු බදුල්ලේ ආණ්ඩුවේ ඒජන්තගෙන් දැනගත හැකිය.

පී. බී. පිහිල්ලේගෙදර,
ආණ්ඩුවේ සහකාර ඒජන්ත,
බදුල්ල දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ
ඒජන්ත වෙනුවට.

කච්චේරිය,
බදුල්ල,
1973 ජූලි මස 04 වැනි දින.

7-576—73.07.20 දින අංක 69 දරණ ගැසට් පත්‍රය

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### වානේ දෙරවල් සහ ජනෙල් සැපයීම සඳහා මිල ගණන් කැඳවීම

පහත දක්වෙන වානේ දෙරවල් සහ ජනෙල් සැපයීම සඳහා පේරාදෙනියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සිවිල් ඉංජිනේරු අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1973 අගෝස්තු මස 10 වෙනි දින පස්වරු 2 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. මෙම තොගය එකවර 1973 ඔක්තෝබර් මස අවසානයට පෙර සැපයිය යුතුය.

| ද්‍රව්‍ය අංකය | ප්‍රමාණය | විස්තරය |
|---|---|---|
| 1 | ... 80 ... | හුලං කොකු සහ අගුල් සමඟ පලු දෙකේ වානේ ජනෙල් අඩි 4 × අඩි 4 |
| 2 | ... 25 ... | හුලං කොකු සහ අගුල් සමඟ මැද පලුව සවිකළ පලු තුනේ වානේ ජනෙල් අඩි 6 × අඩි 4 |
| 3 | ... 5 ... | අගුල් සහ අනු යතුරු සහිතව පලු දෙකේ වානේ දෙරවල් අඩි 7.00″ × අඩි 3.6″ |
| | 10 ... | එම අඩි 6.9″ × අඩි 3. 6″ |
| | 10 ... | එම අඩි 6.3″ × අඩි 3. 00″ |
| 4 | ... 40 ... | හුලං කොකු සහ අගුල් සමග වානේ ජනෙල් අඩි 2 × අඩි 1 |
| 5 | ...හො.20... | මෙම දෙරවල් සහ ජනෙල් වලට වීදුරු සවිකිරීමට සුදුසු පොටි |

3. සියලුම වානේ කොටස් වලට මල නිවාරණ තීන්ත දෙවරක් ආලේප කළ යුතුය.

4. ටෙන්ඩර් කරුවන්ට මින් කොටසකට හෝ සම්පූර්ණයෙන් හෝ ටෙන්ඩර් කළ හැක.

5. 1973 අගෝස්තු මස 10 දින ප.ව. 2 ට පෙර ''සභාපති, ප්‍රාදේශීය ටෙන්ඩර් මණ්ඩලය, සිවිල් ඉංජිනේරු අංශය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පේරාදෙනිය'' යන ලිපිනයට ලැබෙන සේ දෙපිටපතකින් සකස් කළ ටෙන්ඩර් පත් අත්සන් තබා හොඳින් මුද්‍රා තබන ලද කවරයක ''වානේ දෙරවල් සහ ජනෙල් සැපයීම සඳහා මිල ගණන්'' යන්න සඳහන් කොට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුයි.

6. සියලුම ටෙන්ඩර්, ටෙන්ඩර් අවසාන කරන ලද දිනයේ සිට තුන් මසක කාලයක් ඇතුලත භාරගැණීම සඳහා වලංගු විය යුතුය.

7. මිල ගනන් සියල්ල හෝ කොටසක් හෝ එකක් හෝ ප්‍රතික්ෂේප කිරීමට, පිලිගැනීමට සම්පූර්ණ අයිතිය රජය සතුය.

8. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර සඳහා පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධිකාරි ඉංජිනේරු (ගොඩනැගිලි) තැනගෙන් ලබාගත හැකිය.

එල්. එස්. එස්. ජයසුන්දර,
කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙනුවට.

1973 ජූලි මස 05 දින,
පේරාදෙනිය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ,
සිවිල් ඉංජිනේරු අංශයේදීය.

7–547—73.07.20 දින අංක 69 දරණ ගැසට් පත්‍රය

---

මගේ අංකය : ඇල්. එස්./105.

## වවුනියා කච්චේරිය

වවුනියා දිස්ත්‍රික්කයේ දිසාපති විසින් පහත සඳහන් ඉදිකිරීම් වැඩ සඳහා වෙන් වෙන් ව මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත්‍ර 1973. 08. 17 වෙනි දින ප. ව. 2 දක්වා භාරගනු ලැබේ.

(1) කල්මඩු බී.ඕ.පී. පාර වැඩි දියුණු කිරීම සැතපුම් $\frac{3}{4}$ යි.

(2) ඔඩ්ඩයිචාලම්බයිකුලම් පාර තැනීම සැතපුම් 1 යි.

(3) පිරප්පමඩුව බී.ඕ.පී. පාර වැඩි දියුණු කිරීම සැතපුම් $\frac{3}{4}$ යි.

(4) මහකච්චකොඩිය බී.ඕ.පී. පාරේ බෝක්කු තැනීම 4 යි.

2. සියළුම ටෙන්ඩර් පිටපත් දෙකකින් යුක්තවිය යුතු අතර, ඒවා වවුනියා කච්චේරියෙන් (ඉඩම් අංශයෙන්) ලබා ගන්නා ලද නියමිත පෝර්මවල විය යුතුයි. මේ සම්බන්ධයෙන් වෙනත් සියළුම විස්තර වවුනියා කච්චේරියෙන් ලබා ගත හැක.

3. 1973.08.10 වෙනි දින ප.ව. 2 දක්වා මෙම දිසාපති කාර්යාලයෙන් ටෙන්ඩර් පත්‍ර ලබාගත හැක.

4. රජයේ දෙපාර්තමේන්තුවල ලියාපදිංචි කරන ලද කොන්ත්‍රාත් කරුවන් හා අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති, විවිධ සේවා සමුපකාර සමිති සහ ගොවි කාරක සභා පමණක් මෙම වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර එවීමට සුදුස්සෝ වෙති. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන්නන්ට ටෙන්ඩර් පෝර්ම සහ අනිකුත් ලියකියවිලි දෙනු ලබන්නේ ඔවුන් විසින් (එක් එක් වැඩය වෙනුවෙන්) වවුනියා කච්චේරියේ රු. 25 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් පසුවය. ඉහත කී අනුමත කරන ලද සමිති විසින් මෙම තැන්පත් මුදල ගෙවීම අවශ්‍ය නොවන්නේය.

ඒ. එම්. එම්. කුලනායගම්,
දිස්ත්‍රික් ඉඩම් නිලධාරී,
වවුනියා දිස්ත්‍රික්කයේ දිසාපති වෙනුවට.

1973. 06. 29 වැනි දින,
වවුනියා කච්චේරියේ දී ය.

7- 532 —73.07.20 දින අංක 69 දරණ ගැසට් පත්‍රය

---

## පොලිස් දෙපාර්තමේන්තුව

ප්‍රාදේශිකව ලබාගත හැකි මූල ද්‍රව්‍යවලින් සාදන ලද ඉණපටි ගාංචු, නිල තොප්පි ලාංඡන, ගමනාගමන පාලන ලාංඡන සහ බොත්තම් සැපයීම සඳහා 1973.08.10 දින පෙ. ව. 10 දක්වා කොළඹ 1, තැ. පෙ. 517, පොලිස් මූලස්ථානයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

ඉහත සඳහන් වේලාවට ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී එම ස්ථානයට පැමිණ සිටීමට ටෙන්ඩර්කරුවනට අවසර දෙනු ලැබේ.

3. පොලිස් මූලස්ථානයේ පොලිස්පතිගෙන් ලබාගන්නා ලද ටෙන්ඩර් ආකෘති පත්‍රවල පිටපත් දෙකකින් යුක්තව ටෙන්ඩර් පිළියෙල කළ යුතු ය. අවශ්‍ය භාණ්ඩවල සාම්පල් සාමාන්‍ය වැඩ කරන වේලාවන්හිදී පොලිස් මූලස්ථානයේදී පරීක්ෂා කර බැලිය හැකිය.

4. ටෙන්ඩර් තැන්පත් මුදල් වශයෙන් රු. 100 ක් තැන්පත් කොට ඒ බවට ලබා ගන්නා ලද කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් 1973.08.09 දින දවල් 12 දක්වා ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබා ගත හැකිය. තැන්පත් මුදල් පොලිස් මූලස්ථානයේ හෝ කොළඹින් බැහැර ඕනෑම කච්චේරියක තැන්පත් කළ හැකිය.

5. සැම්පලයක් ඉදිරිපත් කළ යුතු ය. මෙය ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනයට පෙර ටෙන්ඩර්කරුගේ නම සඳහන් ලේබලයක් සමග පොලිස් මූලස්ථානයේ තැන්පත් කළ යුතු ය.

6. වැඩි විස්තර පොලිස් මූලස්ථානයෙන් දැනගත හැකිය.

ජී. දුංචිමසන්මයා,
පොලිස්පති වෙනුවට.

1973 ජූලි මස 5 වැනි දින,
කොළඹ 1,
පොලිස් මූලස්ථානයේදී ය.

7-570—73.07.20 දින අංක 69 දරණ ගැසට් පත්‍රය

---

## ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

බදුල්ල දිස්ත්‍රික්කයේ පහත සඳහන් වැඩ සඳහා 1973 අගෝස්තු මස 20 වැනි දින පස්වරු 2.30 දක්වා කොළඹ, තැ. පෙ. 500, ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ටෙන්ඩර් පත් භාර ගනු ලැබේ.

| වැඩෙහි ස්වභාවය | ලියාපදිංචි විය යුතු මුදල |
|---|---|
| රිදීමාලියද්ද ප්‍රා. ආ. නි. කොට්ඨාශයේ, ගුරුමඩ-යල්වෙල පාරේ 1 වන සැතපුමේ මුල් සැතපුම් $\frac{1}{2}$ ගල් අතුරා තාර දැමීම. | රු. 55,000 |

2. ඉහත සඳහන් වැඩ ඉදිරියෙන් සඳහන් කර ඇති ප්‍රමාණයට හෝ ඊට වැඩි ගණනකට රජයේ දෙපාර්තමේන්තුවල කොන්ත්‍රාත් කරුවන් වශයෙන් ලියාපදිංචි වී ඇති අනුමත ග්‍රාම සංවර්ධන සමිති, කම්කරු සමිති හා සමුපකාර සමිතිවලට සහ පෞද්ගලික කොන්ත්‍රාත් කරුවන්ට 1973 අගෝස්තු මස 15 වැනි දින පස්වරු 2.30 තෙක් බදුල්ලේ කච්චේරියේ දී ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ..

3. ටෙන්ඩර් පෝර්ම අපේක්ෂකයින් විසින් බදුල්ල කච්චේරියේ හෝ වෙනත් ඕනෑම කච්චේරියක හෝ අදාල වැඩය වෙනුවෙන් රු. 100 ක මුදල් තැන්පත් කොට ලබා ගත් කුවිතාන්සියක් බදුල්ලේ ආණ්ඩුවේ ඒජන්ත වෙත ඉදිරිපත් කළ විට, ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ. ග්‍රාම සංවර්ධන සමිති, කම්කරු සමිති හා

සමූපකාර සමිති ටෙන්ඩර් ෆෝර්ම ලබා ගැනීමට මුදල් තැන්පත් කිරීම අනවශ්‍යය. චෙක්පත්, මුදල් ඇණවුම්, තැපැල් ඇණවුම් ආදිය භාර ගනු නොලැබේ.

4. ටෙන්ඩර් ෆෝර්ම සම්පූර්ණ කර, පිටපත් දෙකකින් යුක්තව ලේඛනගත තැපෑලෙන් එවිය යුතුයි. ටෙන්ඩර් බහා එවන කවරයට මුද්‍රා තැබිය යුතු අතර, කවරයේ උඩ වම් කෙළවරේ වැඩෙහි නම ලියා තිබිය යුතුය. ටෙන්ඩර් ෆෝර්ම තැපෑලෙන් නොඑවන්නේ නම්, ගාලු මුවදොර, මහ ලේකම් කාර්යාලයේ අංක 320 දරණ කාමරයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුය.

5. 1973 ආගෝස්තු මස 20 වැනි දින පස්වරු 2.30 ට ඉහත කී අංක 320 දරණ කාමරයේ දී ටෙන්ඩර් ෆෝර්ම විවෘත කරනු ලැබේ.

6. තමාගේ ටෙන්ඩර් පත්‍රය භාරගත් බවට ලිපියක් හෝ දැන්වීමක් ලත් පසු, යම් අයෙක් ගිවිසුම් පත් අත්සන් කිරීමට හෝ ඇප තැබීමට හෝ දින 10 ක් ඇතුළත අපොහොසත් වුව හොත්, ඔහු විසින් ටෙන්ඩර් ෆෝර්ම සඳහා තැන්පත් කරන ලද මුදල රාජසන්තක කරනු ලැබේ. ලියාපදිංචි වූ කම්කරු සමිති, විවිධ සේවා සමූපකාර සමිති හා ග්‍රාම සංවර්ධන සමිති ඇප තැබීමෙන් නිදහස්ය.

7. තෝරා ගනු ලබන ටෙන්ඩර්කරු විසින් සපයන ලද ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් ටෙන්ඩර් භාරගත් බවට දැන්වීමක් හෝ වෙනයම් අන්දමකින් එම ලිපිනයට ඒ බව දැන්වීම ටෙන්ඩර්කරුට එය ලැබුණාක් මෙන් සලකනු ලැබේ.

8. මේ කොන්ත්‍රාත්තුව යටතේ වූ වැඩය කරවා ගැනීමට, පුහුණු, අපුහුණු යන දෙවර්ගයේම ලාංකික කම්කරුවන් පමණක් යෙදවීමට කොන්ත්‍රාත්කරු මෙයින් එකඟ වන අතර, ඔවුහු පමණක් එසේ නියුක්ත කරනු ලබන්නාහ. ඒ කම්කරුවන් හැකි තරම් දුරට බඳවා ගත යුත්තේ වැඩය කෙරෙන ප්‍රදේශයේ සිටින අය අතුරිනි.

9. කොන්ත්‍රාත්තුවේ මේ කොන්දේසිය සපුරාලීමට කොන්ත්‍රාත්කරුවා යම් විධියකින් අසමත් වුවහොත්, කොන්ත්‍රාත්තුව අවලංගු වීමට එය තුඩුදෙනවා ඇත. එහෙත්, කොන්ත්‍රාත්තුවට එළඹෙන ලද නිලධාරියා විසින් විශේෂ අවස්ථාවල දී කෘෂිකර්ම හා ඉඩම්, අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ එකඟත්වය උඩ නිශ්චිතව, ලියවිල්ලකින් එකී නිලධාරියා විසින් අනුමත කරන ලද ලාංකික නොවන කම්කරුවන් නියුක්ත කරවීමට කොන්ත්‍රාත්කරුට බලය දිය හැකිය.

10. එවැනි ලිඛිත බලයක් හා එකඟත්වයක් නොමැතිව ලාංකික නොවන කම්කරුවන් යෙදවීමට තහනම් වන අතර, එකී කොන්ත්‍රාත්තුව කඩ කිරීමක් ලෙස සලකනු ලැබේ.

11. මේ කොන්ත්‍රාත්තුවේ අභිප්‍රාය සඳහා "ලාංකික" යන්නෙන්, පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කිරීමෙන් හෝ ශ්‍රී ලංකාවේ රටවැසියෙකු ලෙස අදහස් කෙරෙන අතර, එවැන්නෙක් එකී පාඨයට ඇතුළත් වෙයි.

12. මේ කොන්ත්‍රාත්තුවේ කටයුතු සඳහා යොදවනු ලබන් සෑම කම්කරු කොට්ඨාශයකටම සාධාරණවූ ද, කම්කරුවන්ට වේතන ගෙවීම සම්බන්ධයෙන් දැනට බලපවත්වන සහ මින්මතු ක්‍රියාත්මක විය හැකි සියළුම රෙගුලාසිවලට අනුකූලවූ ද, වේතන ගෙවීමට කොන්ත්‍රාත්කරු මෙයින් එකඟ වෙයි.

13. කොන්ත්‍රාත්කරු විසින් එකී වැඩ කෙරෙහි යොදවනු ලැබූ කම්කරුවන් හා සම්බන්ධ ඔහුගේ පතපොත, පෙරෙට්වු පොත් හා අනිකුත් ලිපි ලේඛන පරීක්ෂා කර බැලීමට ඉඩම් කොමසාරිස් විසින් විධිමත් බලය දෙනු ලැබූ ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ඕනෑම නිලධාරියෙකුට ඒවා පරීක්ෂා කිරීමට ඉඩදීමට කොන්ත්‍රාත්කරු බැඳී සිටී.

14. ටෙන්ඩර් කරුවන්ට අවශ්‍ය වෙනත් තොරතුරු බදුල්ලේ ආණ්ඩුවේ ඒජන්තගෙන් දැනගත හැකිය.

එන්. සී. හාවි,
දිස්ත්‍රික් ඉඩම් නිලධාරි,
බදුල්ල දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ
ඒජන්ත වෙනුවට.

කච්චේරිය,
බදුල්ල,
1973 ජූලි මස 06 වැනි දින.

7-560 —73.07.20 දින අංක 69 දරණ ගැසට් පත්‍රය

---

**ගිස් තාර පීප්ප, හිස් වානේ පීප්ප සහ හිස් සිමෙන්ති මළු විකිණීම සහ ඉවත් කිරීම**

වාරිමාර්ග, විදුලිබලය හා මහාමාර්ග අමාත්‍යාංශයේ උතුරු මැද දිසාවේ, ප්‍රාදේශීය සිවිල් ඉංජිනේරු සංවිධානයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින්—

(1) හිස් තාර පීප්ප,

(2) හිස් වානේ පීප්ප,

(3) හිස් සිමෙන්ති මළු,

විකිණීම සහ ඉවත් කිරීම සඳහා ලාංකිකයන්ගෙන් සහ ලාංකික ආයතනවලින් ටෙන්ඩර් පත් භාර ගනු ලැබේ.

2. ටෙන්ඩර් පත් භාර ගැනීම අවසාන වනුයේ 1973. 08. 21 දින පෙරවරු 10 ට වේ. රු. 100 ක මුදලක් වාරිමාර්ග, විදුලිබලය හා මහාමාර්ග අමාත්‍යාංශයේ ඕනෑම දිසා වැඩ අධ්‍යක්ෂක කාර්යාලයක හෝ යාපනය, ත්‍රිකුණාමලය සහ බදුල්ල කච්චේරි වලින් එකක හෝ තැන්පත් කර කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් පසු 1973. 08. 20 දින තෙක් කාර්යාලීය වේලාව ඇතුළත ටෙන්ඩර් පත් ලබා ගත හැක.

3. ටෙන්ඩර් විවෘත කිරීම 1973. 08. 21 දින පස්වරු 2 ට අනුරාධපුර උතුරු මැද දිසා වැඩ අධ්‍යක්ෂක කායසීාලයේදී සිදුකරණ අතර මෙම අවස්ථාවේ ඕනෑම ටෙන්ඩර් කරුවෙකුට පැමිණ සිටීමට අවසර දෙනු ලැබේ.

4. මෙම ටෙන්ඩරයේ කාල සීමාව 1973. 12. 31 දිනට අවසන්වේ.

5. වැඩිදුර විස්තර අනුරාධපුර උතුරු මැද දිසා වැඩ අධ්‍යක්ෂක කාර්යාලයෙන් ලබා ගත හැක.

ජී. එස්. වික්‍රමසිංහ,
උතුරු මැද දිසා වැඩ අධ්‍යක්ෂක.

1973 ජූලි මස 6 වැනි දින,
උතුරු මැද දිසා වැඩ අධ්‍යක්ෂක කාර්යාලයේදී,
අනුරාධපුරය.

7-676 —73.07.20 දින අංක 69 දරණ ගැසට් පත්‍රය

---

**ලංකා ගමනාගමන මණ්ඩලය**

කොළඹ 5, 200 කිරුළ පාරේ, ලංකා ගමනාගමන මණ්ඩලයේ ටෙන්ඩර් මණ්ඩලීය සභාපති තැන විසින් පහත සඳහන් වැඩ සඳහා 1973 අගෝස්තු මස 08 වෙනි දින පෙ. ව. 10.00 වන තෙක් සීල් තබා ඉදිරිපත් කරන ටෙන්ඩර් භාරගනු ලැබේ.

| වැඩ විස්තරය | | කොන්ත්‍රාත් කරුවන්ගේ අවම ලියාපදිංචි සීමාව |
|---|---|---|
| | | රු. ශ. |
| 1. ගල්කිස්සේ පීරිස් පාරේ, ටිකට් යන්ත්‍ර කර්මාන්ත ශාලාව ඉදි කිරීම—ඉසි/550 | ... | 50,000.00 |
| 2. මොරටුව බස් නැවතුම්පොලේ භූමිය පස් පුරවා සමතලා කිරීම—ඉසි/551 | ... | 25,000.00 |
| 3. හසලක සිපෝ භූමිය පස්කපා සමතලා කිරීම—ඉසි/504 | ... | 25,000.00 |

ප්‍රධාන සිවිල් ඉංජිනේරු තැනගෙන් ලබාගත් ආකෘති පත්‍රවල, පිළියෙල කොට අනුපිටපතින් යුතුව ටෙන්ඩර් පත්‍රිකා ඉදිරිපත් කළ යුතුය. අවශ්‍ය සියලුම විස්තර ප්‍රධාන සිවිල් ඉංජිනේරු තැනගෙන් ලබාගත හැකි අතර, අදාළ සැළසුම් ආදිය ඔහුගේ කාර්යාලයේදී පරීක්ෂා කළ හැක. ලංගම්, රජයේ දෙපාර්තමේන්තුවල හෝ පිළිගත් සංස්ථාවල සිවිල් ඉංජිනේරු වැඩ සඳහා එක් එක් වැඩයට ඉදිරියෙන් පෙන්වා ඇති හෝ ඊට අධිකව ලියාපදිංචිවී සිටින කොන්ත්‍රාත් කරුවන් ටෙන්ඩර් පත්‍රිකා එවීමට සුදුස්සෝ වෙති. අවශ්‍ය ටෙන්ඩර් ලියකියවිලි නිකුත් කිරීම සඳහා ආපසු ගෙවනු ලබන ටෙන්ඩර් තැන්පත් මුදල් වශයෙන් වැඩ අංක: 1, 2, 3 සඳහා එකකට රු. 100 බැගින් ද, ආපසු නොගෙවනු ලබන ටෙන්ඩර් ෆෝර්ම ගාස්තු වශයෙන් වැඩ අංක :1, 2, 3 සඳහා රු. 25 බැගින් ද ප්‍රධාන ගිණුම් නිලධාරී තැන වෙත 1973 අගෝස්තු මස 07 වෙනි දහවල් 12 ට හෝ ඊට පෙර ගෙවා, එම කුවිතාන්සි මාවෙත ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පත්‍රිකා නිකුත් කරනු ලැබේ. තවද, ටෙන්ඩර්කරුවන් සුදුසුදැයි පරීක්ෂා කිරීම සඳහා ඔවුන්ගේ සහතික පත් යනාදිය ප්‍රධාන සිවිල් ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුවේ. ඉහත සඳහන් ටෙන්ඩර් ගාස්තු ප්‍ර. ගි. නි. තැන වෙත මුදලින් තැන්පත් කළ හැක්කේ එම සහතික පත් පිළිගනු ලැබුවේ නම් පමණි.

අංක : 200, කිරුළ පාර,
කොළඹ 5.

ප්‍රධාන සිවිල් ඉංජිනේරු තැන,
ලංකා ගමනාගමන මණ්ඩලය.

7-745 —73.07.20 දින අංක 69 දරණ ගැසට් පත්‍රය

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

### ප්‍රත්‍යාවර්තක උත්පාදක දෙකක් සැපයීම

ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැන විසින් පහත සඳහන් අන්දමේ ප්‍රත්‍යාවර්තක දෙකක් සැපයීම සඳහා 1973. 08. 10 වන දින පෙරවරු 11 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

**දෙකයි.**—තෙකලා (3 phase) 400/230 වොල්ට, කම්බි 4 ප්‍රත්‍යාවර්තක ධාරා උත්පාදක කිලෝවොට් 15 සහ 20 අතර සහ

(අ) සුදුසු වොල්ට මීටරයක්

(ආ) ඇමීටර් තුනක්

(ඇ) ට්‍රිප් ස් විලාසක සහිත තෙකලා පරිපථ වෙන් කරනයක් ආදිය ඇතුලුව.

2. ටෙන්ඩර්කරු විසින් සැපයීම කළ යුත්තේ තිබෙන තොගයෙන් හෝ ආනයනය කර සැපයීමට සහ කිරුළපනයේ මධ්‍යම ගබඩාවට භාරදීමටත් ය. ටෙන්ඩර්කරුවන් විසින් භාරදිය හැකි ඉතාම නුදුරු කාලසීමාව සඳහන් කළ යුතුය.

3. 1973. 08. 09 වෙනි දින දහවල් 12 තෙක් ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැනගෙන් ලබාගත හැකි ටෙන්ඩර් ෆෝර්මයක අනුපිටපතකුත් සමග ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි. ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තු කාර්යාලයේ හෝ කොළඹ යෝර්ක් වීදියේ ලංකා බැංකු කාර්යාලයේ ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂතැනගේ ගිණුමට හෝ කොළඹින් බැහැර කච්චේරියක හෝ රු. 50 ක් තැන්පත්කොට ලබාගත් කුවිතාන්සියක් ටෙන්ඩර් ෆෝර්ම ලබා ගැනීමට මත්තෙන් ඉදිරිපත් කළ යුතුයි.

4. ටෙන්ඩර් ෆෝර්ම ආදිය ලබාගත් පසු ටෙන්ඩර් කිරීමට නොහැකිවූවන්ගේ ටෙන්ඩර් තැන්පත් මුදල් ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනයට හා නියමිත වේලාවට පෙර ඉදිරිපත් කළ හොත් පමණක් ආපසු ගෙවනු ලැබේ.

5. සියලු ටෙන්ඩර් කවරයන්හි වම් පස ඉහළ කෙළවරේ "ප්‍රත්‍යවර්තක උත්පාදක දෙකක් සැපයීම සඳහා ටෙන්ඩර්" යනුවෙන් සඳහන් කොට ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ, එච්ලන් චතුරශ්‍රය, කොළඹ 1, යන ලිපිනයට එවිය යුතුයි. කවරයේ වම් පස පහළ කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය සඳහන් කළ යුතුයි. ටෙන්ඩර් ලියාපදිංචි කළ තැපෑලෙන් පුද්ගලික නියෝජිතයෙකුගේ මාර්ගයෙන් හෝ තමා විසින් හෝ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරී තැනට භාරදිය යුතුයි.

6. ටෙන්ඩර් ස්ථිර වූවාක් මෙන්ම කිසියම් වෙනස් කිරීමකට අදාළ නොවිය යුත්තේය. ටෙන්ඩර් සලකා බැලීමට ඇති හෙයින් විවෘත කළ දින සිට දින 60 ක් යන තෙක් ඒවා ආපසු ගෙන්වා ගත නොහැකිය.

7 ටෙන්ඩර්කරුවන් සැපයීම පිළිබඳව සම්පූර්ණ විස්තරයක් ඉදිරිපත් කළ යුතුයි. පිළිගත් විස්තරයකට යම්කිසි වෙනස්වීමක් වෙතොත් ඒ බැව් සඳහන් කළ යුතුයි.

8. සාර්ථක වූ ටෙන්ඩර්කරු සැපයීම පැහැර හැරියොත් තැන්පත් මුදල රාජසන්තක වනවා පමණක් නොව, රජයේ කොන්දේසි කඩ කරන කොන්ත්‍රාත්කරුවන්ගේ ලේඛනයට ඔහුගේ නමද ඇතුළත් වන්නේ ය.

9. කොළඹ, එච්ලන් චතුරශ්‍රයේ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේදී 73. 08. 10 වැනි දින පෙරවරු 11 ට ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. කැමති ටෙන්ඩර්කරුවන්ට ඒ අවස්ථාවේදී පෙනී සිටිය හැක.

10. කිසියම් ප්‍රශ්න කිරීමක් නොමැතිව ටෙන්ඩරයක කොටසක් හෝ සම්පූර්ණයෙන්ම හෝ ප්‍රතික්ෂේප කිරීමට හෝ ටෙන්ඩරයේ කොටසක් පිළිගැනීමේ අයිතිය රජය සතුය.

11. වැඩි විස්තර සඳහා ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධිකාරී ඉංජිනේරුතැනගෙන් විමසන්න.

පී. රත්නසිංහම්,
ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ වෙනුවට.

සීපී/2/456.
ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තු කාර්යාලය,
කොළඹ,
1973. 07. 09

7-749 —73.07.20 දින අංක 69 දරණ ගැසට් පත්‍රය

---

පීඑස් සී.2/19/23.

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### කැටරැක් ඇස් කණ්නාඩි සැපයීම පිණිස ටෙන්ඩර් භාර ගැනීම

පහත සඳහන් උපලේඛනයෙහි දැක්වෙන පරිදි කැටරැක් ඇස් කණ්නාඩි සැපයීම පිණිස 1973. 08. 21 දින පූ. භා. 10 දක්වා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් දේශීය නිෂ්පාදකයින් ගෙන් ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ.

2. ටෙන්ඩර්කරුවන් විසින් තමන් විසින්ම සකස් කළ ටෙන්ඩර් පත්‍ර පිටපත් දෙකකින් සම්පූර්ණ කොට කවරවල බහා මුද්‍රා තබා "කැටරැක් ඇස් කණ්නාඩි සැපයීම් පිණිස ටෙන්ඩර් පත්‍රය" යනුවෙන් කවරයේ වම් කෙළවර මුදුනේ සඳහන් කොට කොළඹ 10, තැ. පෙ. 584 සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත එවිය යුතුයි.

3. ටෙන්ඩර් පත්‍ර ඉහත 2 වැනි ඡේදයේ ලිපිනය සඳහන් ස්ථානයේ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ (ගිණුම් අංශයේ) තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ දැමීමට හෝ ලේඛනගත තැපෑලෙන් එවීමට පිළිවන. ලේඛනගත තැපෑලෙන් එවීමට අකමැති ටෙන්ඩර්කරුවන් තමන්ම හෝ ඔවුන්ගේ නියෝජිතයින් මගින් සැපයීම් විස්තර නාම සහ ලිපිනය සඳහන් මුද්‍රා සහිත කවරවල බහාලන ලද ටෙන්ඩර් පත්‍ර ඉහත 2 වැනි ඡේදයේ ලිපිනය සඳහන් ස්ථානයේ එවැනි ටෙන්ඩර් භාර ගැනීමට බලයලත්, ප්‍රධාන ගණකාධිකාරී වෙත පුද්ගලිකව භාරදිය යුතුයි. මුද්‍රා සහිත ටෙන්ඩරය භාර දෙන්නාට ඔහු විසින් ටෙන්ඩරය භාරගත් බවට දැනුම් දීමේ කුවිතාන්සියක් නිකුත් කරනවා ඇත.

4. රුපියල් 100ක මුදලක් කච්චේරියක (කොළඹ කච්චේරියේ) හැර හෝ කොළඹ ඩීන්ස් පාරේ අංක 355 හි රජයේ බෙහෙත් ගබඩා අධිකාරී කාර්යාලයේ තැන්පත් කළ යුතුයි. මුදල් තැන්පත් කළ බවට ලද රිසිට්පත ටෙන්ඩරයට ඇමිණිය යුතුයි.

5. ඕනෑම ටෙන්ඩරයක් හෝ සියළුම ටෙන්ඩර් හේතු නොදක්වා ඉවත දැමීමට සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයට බලය ඇත. මෙම දැන්වීමේ සඳහන් සියළුම කොන්දේසි සම්පූර්ණ ලෙස පිළිපැද නොමැති කිසිම ටෙන්ඩරයක් සලකා බලනු නොලැබේ.

6. තෝරාගත් ටෙන්ඩර්කරු විසින් නියමිත කාලසීමාව තුළදී කණ්නාඩි සැපයීමට අසමත් වුවහොත් ටෙන්ඩර් ඇප මුදල රාජසන්තක කරන අතර වැඩි දුරටත් ඒ සම්බන්ධයෙන් ක්‍රියා කරනු පිණිස බලය ලත් නිලධාරි තැනට වාර්තා කරනු ලැබේ.

7. සියළුම ටෙන්ඩර්කරුවන්ට ඉහත 2 වැනි ඡේදයේ සඳහන් ස්ථානයේදී, නියමිත දින, නියමිත වේලාවට, ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී පැමිණ සිටීමටට ඉඩ දෙනු ලැබේ. ටෙන්ඩර්කරුවන්ගේ නම් මෙන්ම ඉල්ලුම් කොට ඇති මිළ ගණන්ද පැමිණ ඇති ටෙන්ඩර්කරුවන්ට ප්‍රකාශ කරනවා ඇත. ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී යම් ටෙන්ඩරයක් නිරීක්ෂණය කිරීම සඳහා ඉල්ලුම් කරන ටෙන්ඩර්කරුවෙකුට ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙතින් පිළියෙල කොට ගත් අවස්ථාවකදී ඕනෑම ටෙන්ඩරයක අනු පිටපත නිරීක්ෂණය කිරීමට ඉඩ දෙනු ලැබේ.

එන්. කේ. පී. විජයසිංහම්,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙනුවට.

1973 ජූලි මස 3 දින,
කොළඹ රජයේ බෙහෙත් ගබඩාවේ දී ය.

### Schedule referred to

Catract Spectacles with locally manufactured frames which should be reinforced with wire inside—Facial breath 100 mm. Inter pupillory distance 55 to 60 mm to be supplied as follows complete with case :—

(a) 1000 pairs size + 10.0 D's distance glasses
(b) 50 pairs size + 9.0 D's distance glasses
(c) 50 pairs size + 13.0 D's distance glasses

*Note.*—The frames should conform to requirements and be well fitting and the glasses should be properly fixed.

*Prices.*—Prices should be quoted per pair inclusive of case for delivery at Civil Medical Stores, Colombo. Prices should be shown separately for each item (*a*), (*b*) and (*c*).

*Samples.*—Samples (non returnable) should be sent direct to the Superintendent, Civil Medical Stores, 355, Deans Road, Colombo 10, on or before the closing date of tenders and should be marked "Samples—Cataract Spectacles—CMS 3050".

7-487—73.07.20 දින අංක 69 දරණ ගැසට් පත්‍රය

## මීරිගම සුළු නගර සභාව.

පහත උපලේඛනයේ සඳහන් කර්මාන්ත සඳහා, රජයේ හා පළාත් පාලන ආයතනයන්හි ලියාපදිංචිවී ඇති කොන්ත්‍රාත් කරුවන් ගෙන් සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර කැඳවනු ලැබේ. අංක 1 සිට 4 දක්වා කර්මාන්ත සඳහා රු. 25,000 වැඩි කර්මාන්ත කිරීමට ලියාපදිංචිවූ සහතිකයක් තිබිය යුතුයි. ටෙන්ඩර් පෝර්ම නියමිත ගාස්තු ගෙවා නගර සභා කාර්‍යාලයෙන් ලබා ගත යුතුයි.

1. ටෙන්ඩර් පෝර්ම නිකුත් කිරීම.—1973.7.26 දින පස්වරු 2 දක්වා.
2. ටෙන්ඩර් භාර ගැනීම.—1973.7.27 පෙරවරු 10.30 දක්වා.

වැඩි විස්තර මීරිගම සුළු නගර සභා කාර්‍යාලයෙන් ලබා ගත හැක.

### උපලේඛනය

| | කර්මාන්තයේ නම | ටෙන්ඩර් පෝර්ම ගාස්තුව රු. ශ. | ටෙන්ඩර් ඇප තැන්පත් රු. ශ. |
|---|---|---|---|
| 1. | මීරිගම නව වෙළඳ පොල අසල වැසිකිලිය ජලමුද්‍රා කිරීම ... ... ... ... | 10 0 | ... 250 0 |
| 2. | පස්යාල පාරේ පැති කානු තැනීම ... ... ... ... ... ... | 4 0 | ... 75 0 |
| 3. | අමරතුංග මාවත ප්‍රතිසංස්කරණය කිරීම ... ... ... ... ... | 2 50 | ... 25 0 |
| 4. | සුමනසාර මාවත ප්‍රතිසංස්කරණය කිරීම ... ... ... ... ... | 2 50 | ... 25 0 |
| 5. | අංක 2 වසුරු කරත්තය අළුත් වැඩියා කිරීම ... ... ... ... ... | 1 0 | ... 10 0 |
| 6. | අංක 3 වසුරු කරත්තය අළුත් වැඩියා කිරීම ... ... ... ... ... | 1 0 | ... 10 0 |
| 7. | අංක 4 වසුරු කරත්තය අළුත් වැඩියා කිරීම ... ... ... ... ... | 1 0 | ... 10 0 |

ජේ. ඊ. අමරතුංග,
සභාපති.
මීරිගම සුළු නගර සභාව.

1973 ජූනි මස 21වන දින,
මීරිගම සුළු නගර සභා කාර්‍යාලයේදීය.

7-692—73.07.20 දින අංක 69 දරණ ගැසට් පත්‍රය

---

## ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

ඛනිජ ද්‍රව වායු සඳහා අධි පීඩන භාජන සහ කේන්ද්‍රාපසාරී (සෙන්ට්‍රිපියුගල්) පොම්ප සැපයීම සඳහා ටෙන්ඩර් පත් කැඳවීම

ඉහත සඳහන් ටෙන්ඩර් පත් භාර ගැනීම 1973.08.17 වෙනි දින පෙ. ව. 10 තෙක් කල් දමා ඇත.

නිකුත් කරණ ලද ටෙන්ඩර් පිළිබඳ නියමිතයන් අනුව ටෙන්ඩර් කැඳවනු ලබන්නේ ඛනිජ ද්‍රව වායු සඳහා අධි පීඩන භාජනවලට පමණක් බවත්, කේන්ද්‍රාපසාරී (සෙන්ට්‍රිපියුගල්) පොම්ප සැපයීම සඳහා නොවන බවත් සැලකිය යුතුය.

ගබඩා හා සැපයීම් කළමනාකරු.

113, ගාලු පාර,
කොළඹ 3.

7-695/1—73.07.20 දින අංක 69 දරණ ගැසට් පත්‍රය

---

## ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

ටොන් 15-20 ප්‍රමාණයේ රථ වාහන ආදිය කිරන (පාවිච්චි කරන ලද) තරාදියක් (Weighbridge) උවමනාකර තිබේ

ඉහත සඳහන් දේ සැපයීම සඳහා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් සීල් තබන ලද මිල ගණන් පත් කැඳවනු ලැබේ. "රථ වාහන කිරන තරාදියක් සැපයීම සඳහා මිල ගණන් පත්" යනුවෙන් ලියුම් කවරයේ වම් උඩ කෙලවරේ සඳහන් කොට මිල ගණන් පත් 1973 අගෝස්තු 3 දින පෙ. ව. 10 ට පෙර ගබඩා හා සැපයීම් කළමනාකාර තැනගේ කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුය. නැතහොත් එදින නියමිත වේලාවට පෙර ඔහු වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

ගබඩා හා සැපයීම් කළමනාකරු.

113, ගාලු පාර,
කොළඹ 3.

7-695/2—73.07.20 දින අංක 69 දරණ ගැසට් පත්‍රය

---

## ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව

ටෙන්ඩර් පත් කැඳවීම—හානි වූ බඩු විකිණීම සඳහා

පහත සඳහන් හානි වූ බඩු මිලයට ගැනීම සඳහා මුද්‍රා තැබූ ටෙන්ඩර් පත් කැඳවනු ලැබේ.

ප්ලාස්ටික් වැසිකිලි අසුන් සහ කවර 9 ක් සහ අසුන් කවර 162.

තේ පෙට්ටි ලෑලි 2300.

කාබන් බ්ලැක් අයිසැෆ් රා. 13799 සහ ජීපඑෆ් 1567.

තේ රාත්තල් 4,500.

චිප්-බෝඩ් නිපදවන යන්ත්‍රයකට අයත් වී-බෙල්ට් ෆ්ලයි වීල් 1යි.

ඇස්බැස්ටොස් ෆයිබර් රා. 447.

ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ යුත්තේ කොළඹ 1, ගෆ්පූර් ගොඩනැගිල්ලේ, මුහුදු කළමනාකරුගෙන් ලබාගන්නා පෝර්මයන් මගිනි. 1973 අගෝස්තු මස 7 වැනි දින ප. ව. 1.30 ට ටෙන්ඩර් පත් භාරගැනීම අවසන් වේ.

කළමනාකරු,
මුහුදු ආරක්ෂණ දෙපාර්තමේන්තුව.

7-694—73.07.20 දින අංක 69 දරණ ගැසට් පත්‍රය

# තීරණය කළ ටෙන්ඩර්පත් පිළිබඳ දැන්වීම්

**ප්‍රාදේශීය සිවිල් ඉංජිනේරු සංවිධානය—බටහිර දිසාව**

| සැපයීමේ/සේවයේ විස්තර | ටෙන්ඩර්පත් පියවූ දිනය | ලැබූ ටෙන්ඩර් ගණන | පිළිගත් ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනය | පිළිගත් ටෙන්ඩරයේ මුදල |
|---|---|---|---|---|
| කැළණි උතුරු බැම්මේ 2 වන සැතපුමට බොරළු කියුබ 2,500ක් සැපයීම | 1973.06.11... | 5 ... | යූ. ඒ. පෙරේරා මහතා, 624, වේල්ස් කුමාර මාවත, කොළඹ 14 | රු. 69,000.00 |
| හිස් තාර පීප්ප/හිස් වානේ පීප්ප සහ හිස් සිමෙන්ති කරදසි උර මිළ දී ගෙන අස්කර හැනීම | 1973.06.13... | 5 .... | හිස් තාර පීප්ප<br>ඒ. එල්. එම්. සගායම් මහතා, 356, මීගමු පාර, වත්තල | ලබාගන්නා 1 වෙනි ස්ථාන තුනෙන් රු. 6.31 බැගින් සහ 4 වෙනි ස්ථානයෙන් රු. 5.51 බැගින් |
| | | | හිස් වානේ පීප්ප<br>එම්. සී. මස්තාන් මහතා, 218/7, පන්චිකාවත්ත පාර, කොළඹ 10 | එකක් රු. 13.85 බැගින්<br>එකක් රු. 13.85 බැගින්<br>එකක් රු. 13.50 බැගින්<br>එකක් රු. 12.25 බැගින් |
| | | | හිස් සිමෙන්ති උර<br>එම්. සී. මස්තාන් මහතා, 218/7, පන්චිකාවත්ත පාර, කොළඹ 10 | එකතු කරන ස්ථානවලින් එකක් රු. 0.67 බැගින් |

ඇන්. පී. ඒ. විජේසේකර,
බටහිර දිසා වැඩ අධ්‍යක්ෂ වෙනුවට.

තැ. පෙ. 1514,
කොළඹ 7, 1973 ජූලි මස 5 වැනි දින.

7–575—73.07.20 දින අංක 69 දරන ගසට් පත්‍රය

---

# බඩු බාහිරාදිය විකිණීම

**යුද හමුදා මූලස්ථානය**

පරිහරණයට නුසුදුසු බඩුබාහිරාදිය ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

1. පරිහරණයට නුසුදුසු ටයර් 1055 ක්, 1973 ජූලි මස 31 වෙනි අඟහරුවාදා පෙරවරු 10 පැයට හෝමාගම, පනාගොඩ පිහිටි යුද හමුදා යුධෝපකරණ ගබඩාවේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

2. වෙන්දේසියේ මිළදී ගනුලබන භාණ්ඩ සඳහා සම්පූර්ණයෙන් මුදල් ගෙවිය යුතු අතර එම භාණ්ඩ එදිනම යුධෝපකරණ ගබඩා පෙදෙසින් ඉවත් කර ගත යුතුය.

3. මෙම භාණ්ඩ 1973 ජූලි මස 30 වෙනි සඳු දින පෙරවරු 9.30 පැයේ සිට පස්වරු 3.30 පැය දක්වා කාලය තුළ පහත සඳහන් ස්ථානයේදී පරීක්ෂාකළ හැක.

යුධෝපකරණ ගබඩාව,
යුද හමුදා ජනපදය,
පනාගොඩ-හෝමාගම.

ඇම්. ඒ. ජයවීර,
බ්‍රිගේඩියර්,
යුද හමුදා ආඥාපති වෙනුවට.

යුද හමුදා මූලස්ථානය,
තැ. පෙ. 553, කොළඹ,
1973 ජූලි මස 10 වෙනි දින.

7–733—73.07.20 දින අංක 69 දරන ගැසට් පත්‍රය

---

**ජේගුවේ වෙන්දේසියක්**

කොළඹ, ජේගුවේ පී 2 ගුදමේ තැන්පත් පහත සඳහන් බඩු 1973 ජූලි මස 31 වෙනි දින පෙ.ව. 9.30 ට එම ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. 1973 ජූලි මස 30 වෙනි දින එම බඩු ගැණුම්කරුවනට පරීක්ෂා කර බැලීමට පිළිවන.

ඉල්ලීම් අවසානයේදී වැඩිම ඉල්ලුම්කරු විසින් මිළයට ගන්නා භාණ්ඩයෙහි වටිනාකමින් සියයට 50 ක මුදලක් තැන්පත් කළ යුතුය.

මෙම වෙන්දේසියෙන් මිළයට ගන්නා බඩු වෙන්දේසිය අනුමත කර දින හතකින් ගෙන නොගියහොත් එම බඩු නැවත විකුණන බවත්, ඒ සඳහා ගෙවා ඇති අත්තිකාරම් මුදල් රාජසන්තක වන බවත් සැලකිය යුතුය. වෙන්දේසිය පිළිබඳ අනිකුත් කොන්දේසි සඳහා 1954 මැයි මස 28 වෙනි දින ගැසට් පත්‍රය බලන්න.

වී. බී. ඒ. දසනායක,
ප්‍රධාන ජේගු අයකැමි වෙනුවට.

මගේ අංකය : ඒඩී/1/73.
1973 ජූලි මස 10 වන දින,
කොළඹ, ජේගු දෙපාර්තමේන්තුවේ දී ය.

1. ඇලුමිනියම් ආධාරක පෙට්ටි 1
2. යන්ත්‍රෝපකරණ පෙට්ටි 1
3. fපිල්ටර් කාට්රිජ් ඇඩප්ටර් කෑලි 9
4. fප්ලොරසන්ට් පියුබ් 8
5. රෙදි නූල් පන්දු 15
6. රෙදි නූල් පන්දු 23
7. "ගුඩ්ඉයර්" ටයර් 175×13 2
8. රසායනික ද්‍රව්‍ය බෝතල් 27
9. "කැසල්ලා" රසායන ද්‍රව්‍ය කුඩා පීප්ප 1
10. "බ්‍රිජ්ස්ටෝන්" ටයර් 400×8, 400×10 } 2
11. ගම්මිරිස් මලු 1
12. සුදු යකඩ විලේප බෝතල් 24
13. රසායන ද්‍රව්‍ය "කෙල්තේන් එම්එෆ්" පොලිතීන් භාජන 2
14. රසායන ද්‍රව්‍ය කාටන් 1
15. බ්රේක් ලයිනිං කෑලි 18
16. කපු රෙදි (හානිවූ) මලු 1
17. රසායන ද්‍රව්‍ය ටින් 45
18. කිරි බෝතල් 30
19. ඖෂධීය ග්ලූකෝස් බී. පී. ටින් 16
20. fපික්ෂොප්‍රින්ට් රසායන ද්‍රව්‍ය පොලිතීන් භාජන 2
21. ධාන්‍ය තෙල් බෝතල්
22. රෙදි නූල් රාත්තල් 85
23. පා පැදි දම්වැල් සෑදීමේ කොටස් පෙට්ටි 57
24. රසායනික සායම් පෙට්ටි 2
25. ඖෂධ බෝතල් 193
26. හිස් මලු මිටි 12
27. යකඩ පට්ටම් රෝල් 17
28. මුද්‍රණ කුඩු පෙට්ටි 1
29. රසායනික ද්‍රව්‍ය (විවිධ) පෙට්ටි 1
30. මහන නූල් පෙට්ටි 1
31. පීප්ප සෑදීමට ගන්නා තහඩු පීප්ප 4
32. යන්ත්‍ර අමතර කොටස් පෙට්ටි 1
33. ගෑස්කට් පෙට්ටි 1
34. ලන්තෑරුම් "ක්වැන්ග්හවා" කාටන් 1
35. කඩදාසි ක්ලිප්ස් පෙට්ටි 1
36. ටියුබ් "පිරෙල්ලි" 165×13 පාර්සල් 2
37. "ලිෂා" යන්ත්‍ර සිරස් හා අමතර කොටස් පෙට්ටි 3

38. ඉරි "ලස්ට්‍රා" පෙට්ටි 1
39. ක්ලච් කොල් දොඩම් සිරප් පෙට්ටි 14
40. "මිචලින්" ටයර් 450×16 2යි
41. "ඩන්ලොප්" ටයර් 500×15 1
42. ප්‍රසාරණ කම්බි දරනු 17
43. අයි. සී. අයි. රසායන ද්‍රව්‍ය ටින් 3
44. "සෙල්ඩියොන්" තෙතමන කුඩු පෙට්ටි 1
45. 1972 දින පොත් 9
46. යන්ත්‍ර අමතර කොටස් (ඩිෆියුසර්) පෙට්ටි 1
47. "බෲනර්" යන්ත්‍ර අමතර කොටස් පැලට් 2
48. යුරෝපීය ආසන (සම්පූර්ණ සෙට් 2) ක්‍රේට් 1
49. ඇරොබොන් කුඩු 1
50. කාඩ්බෝඩ් මිටි 4
51. පත්‍රිකා කාටන් 1
52. සජල හුණු (හයිඩ්රේටඩ් ලයිම්) මලු 21
53. මිශ්‍ර රසායනික ද්‍රව්‍ය මලු 29
54. පී.වී.සී. සංයුක්ත (කම්පවුන්ඩ්) මලු 80
55. පී. වී. සී. සංයුක්ත (කම්පවුන්ඩ්) මලු 2
56. රසායනික ද්‍රව්‍ය කුඩු මලු 2
57. රසායනික ද්‍රව්‍ය කුඩු මලු 2
58. පී. වී. සී. සංයුක්ත (කම්පවුන්ඩ්) මලු 3
59. රසායනික ද්‍රව්‍ය කුඩු මලු 1
60. පී. වී. සී. සංයුක්ත (කම්පවුන්ඩ්) මලු 4
61. රෙදි නූල් කාටන් 1
62. රසායනාගාර රසායනික ද්‍රව්‍ය පෙට්ටි 1
63. රසායනාගාර රසායනික ද්‍රව්‍ය පෙට්ටි 1
64. පොල්රස සාර බෝතල් 4
65. රසායනික ද්‍රව්‍ය පීප්ප 2
66. අසුරන ලද කොහු කෙඳි පෙට්ටි 1
67. අසුරන ලද කොහු කෙඳි පෙට්ටි 1
68. පල්ප් ලෑලි පෙට්ටි 1
69. සිනක්කාරම් මලු 3
70. යකඩ පට්ටම් රෝල් 2
71. රසායනික ද්‍රව්‍ය පීප්ප 1
72. පත්‍රිකා පෙට්ටි 1
73. මුද්‍රණ කඩදාසි බේල් 1
74. "යමහ" ප්‍රසිද්ධ කරන ද්‍රව්‍ය පෙට්ටි 1
75. පෞද්ගලික බඩුමුට්ටු සූට්කේස් 1
76. "ඩයල්-ඒ-චාර්ජ්" (මීටරය සමග චාර්ජින් සිලින්ඩර්) 2
77. ගිනිපෙට්ටි කඩදාසි (මැච්පේපර්) රෝල් 15
78. යන්ත්‍ර රෝද පෙට්ටි 1
79. ටින් තහඩු මිටි 3
80. මාර්බල් කෑලි මලු 12
81. ටින් තහඩු (රවුම්) කාටන් 1
82. කහ මලු 4
83. කර්මාන්තශාලීය අත්පොත් පෙට්ටි 1
84. මැනිලා කඹ රෝල් 9
85. ජිග්මා අංක 631 වර්ගයේ යන්ත්‍ර කොටස් පෙට්ටි 1
86. "අජලේය ඊතර්" (ඇන්හයිඩ්‍රස් ඊතර්) රසායන ද්‍රව්‍ය ටින් 5
87. වතු ආවුද කෑලි 5
88. බැටරි ආවරණ (බේක්ලයිට්) කාටන් 3
89. "සිබර්ලිංග්" ටයර් 520×13 7 යි
90. 1972 කැලැන්ඩර් 1
91. රෙදි නූල් පෙට්ටි 1
92. දුනු කොල මිටි 1
93. රෙදි නූල් රාත්තල් 680
94. සිලිකෝන් කාර්බයිඩ් පෙට්ටි 1
95. රෙදි නූල් පන්ද 105
96. රෙදි නූල් පන්ද 31
97. පිගන් මැටි කෝප්ප මූඩි සමග ක්‍රේට් පෙට්ටි 1
98. රසායනික සායම් කුඩු පෙට්ටි 3
99. යව (මෝල්ට්) පිසදමන කුඩු මලු 28
100. එනීමේ කඩදාසි රෝල් 482
101. හිස් පෙට්ටි 31
102. යන්ත්‍ර කොටස් පෙට්ටි 1
103. ආයුර්වේද ඖෂධ (වදකහ සහ වලහසහල්) මලු 45
104. මෝටර් රථ උපකරණ පෙට්ටි 1

7-734—73.07.20 දින අංක 69 දරණ ගැසට් පත්‍රය

---

**ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව**

මාතලේ දිස්ත්‍රික් ගබඩාව

ප්‍රයෝජනයට ගත නොහැකි භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි.

මාතලේ පොලිස් දිස්ත්‍රික් ගබඩාවේදී 1973 ක්වූ ජූලි මස 26 වෙනි දින පෙරවරු 9 ට පහත දැක්වෙන සේවයට නුසුදුසු භාණ්ඩයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

| තොග අංකය | විස්තරය |
|---|---|
| 1. .................... | තුවක්කු තබන රාක්ක එකයි. |
| 2. ...... .............. | බයිඇලසින් ලාම්පු තුනයි. |
| 3. .................... | දින මුද්‍රා දෙකයි. |
| 4. .................... | රෙදි මදින ඉස්ත්‍රික්ක එකයි. |
| 5. .................... | පරණ නීති පොත් අසූ එකයි. |
| 6. .................... | ඇලුමිනියම් පිගන් විසිතුනයි. |
| 7. .................... | ඉඹි යතුරු දහතුනයි. |
| 8. .................... | පීඩන ලාම්පු එකයි. |
| 9. .................... | කොහු ගුදිරි තිස්නවයයි. |
| 10. .................... | විදුලි කේතල් එකයි. |
| 11. .................... | ඡායා රූප ගැනීමේ රෝල විසිඑකයි. |
| 12. .................... | ඡායා රූප මුද්‍රිත කඩදාසි හතරයි |

2. වෙන්දේසි කරන දිනයේ පෙරවරු 8 සිට මෙම භාණ්ඩයන් පරීක්ෂාකල හැක.

3. වෙන්ද්සිය නිමාවෙත්ම, සම්පූර්ණයෙන්ම මුදල් ගෙවිය යුතු අතර, මිලදී ගත් භාණ්ඩයන් එදිනම ඉවත්කර ගත යුතුය.

ජේ. ඒ. බණ්ඩාරණායක,
සහකාර පොලිස් අධිකාරි, මාතලේ.

සහකාර පොලිස් අධිකාරි කායර්‍යාලය,
මාතලේ,
1975.06.22 වෙනි දින දී ය.

7-571—73.07.20 දින අංක 69 දරණ ගැසට් පත්‍රය

---

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**

වෙන්දේසියේ විකිණීමයි

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවට අයත් කුඩා ගෝනි 790 ක් (දිග අඟල් 36යි පළල අඟල් 18යි) එම දෙපාර්තමේන්තුවේ සැපයීම් ශාඛාවේදී 1973 ජූලි 30 දින අපරභාග 2ට වෙන්දේසියේදී විකුණනු ලැබේ.

වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර ගෝනි පරීක්ෂා කිරීමට ඉඩ දෙනු ලැබේ.

මිලයට ගත් ගෝනි සඳහා එවලේම මුදල් ගෙවා ගෝනි ඉවත් කරගෙන යා යුතුය.

බෝගොඩ ප්‍රේමරත්න,
විභාග කොමසාරිස්.

1973.07.4 වැනි දින,
කොළඹ 2,
විභාග දෙපාර්තමේන්තුවේදීය.

7-642—73.07.20 දින අංක 69 දරණ ගැසට් පත්‍රය

### මහේස්ත්‍රාත් උසාවිය—මහව

#### භාණ්ඩ වෙන්දේසිය

රාජසන්තක කරන ලද සහ අයිතිවාසිකම් ඉදිරිපත් නොකරන ලද පහත සඳහන් භාණ්ඩ කල්වේලා ඇතිව හිමිකම් ඉදිරිපත් නොකරන්නේ නම් එම භාණ්ඩ 1973 ක්වූ ජූලි මස 28 වැනි දින පෙරවරු 10 ට ආරම්භකර මහව මහේස්ත්‍රාත් උසාවි භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

එම භාණ්ඩ 1973 ක්වූ ජූලි මස 28 වැනි දින පෙරවරු 8 සිට 9 දක්වා පරීක්ෂාකර බැලිය හැක.

වෙන්දේසියේදී සාර්ථක ඉල්ලුම්කරුවන් විසින් මිළදී ගන්නා ලද භාණ්ඩ සඳහා ඒ අවස්ථාවේදීම නියමිත මුදල් ගෙවා එම භාණ්ඩ වහාම උසාවි භූමියෙන් ඉවත් කර ගත යුතුය.

මා. ශ්‍රී. සෙ. කොරයා,
මහේස්ත්‍රාත්, මහව.

1973 ක්වූ ජූනි මස 28 වැනි දින,
මහව, මහේස්ත්‍රාත් උසාවියේදීය.

#### භාණ්ඩ ලැයිස්තුව

| නඩු අංකය | | විස්තර |
|---|---|---|
| 1. 23307 | ... | පැට්‍රොමැක්ස් ලාම්පු එකයි |
| 2. 25465 | ... | 1. කැති එකයි<br>2. වප් පිහියා එකයි |
| 3. 25957 | ... | කැති එකයි |
| 4. 26508 | ... | පැන්සල් එකයි |
| 5. 26996 | ... | මැන්ටල් එකයි |
| 6. 27219 | ... | මවුත්ඕගන් එකයි |
| 7. ඒ/4732 | ... | අංක BG 51244 දරන පාපැදිය |
| 8. ඒ/4949 | ... | වියලි මිරිස්<br>සූට් කේස් දෙකයි<br>ගමන් මළු එකයි |
| 9. ඒ/4969 | ... | වියලි මිරිස්<br>ගමන් මලු එකයි |
| 10. ඒ/5116 | ... | අංක DX 1583 දරණ පාපැදිය |
| 11. — | ... | ලොකු ප්ලාස්ටික් කෑන් 6 යි |
| 12. — | ... | කුඩා ප්ලාස්ටික් කෑන් 9 යි |
| 13. — | ... | කුඩා බෝතල 175 යි |
| 14. — | ... | මැටි මුට්ටි 14 යි |
| 15. — | ... | කුඩා හා ලොකු බැරල් 18 යි |
| 16. — | ... | ලොකු බෝතල 5 යි |

7–643—73.07.20 දින අංක 69 දරණ ගැසට් පත්‍රය

---

#### වෙන්දේසියේ විකිණීමයි

දකුණු කොළඹ මහෙස්ත්‍රාත් උසාවියේ ඇති රාජ සන්තක කරන ලද භාණ්ඩ සහ අයිතිකරුවන් විසින් රැගෙන ගොස් නොමැති භාණ්ඩ 1973. 08. 25 වෙනි දින ප. ව. 1 ට දකුණු කොළඹ මහෙස්ත්‍රාත් උසාවි භූමියේදී වෙන්දේසියේ විකුණනු ලැබේ.

වෙන්දේසියේ විකුණනු ලබන භාණ්ඩ පිළිබඳ සම්පූර්ණ ලැයිස්තුවක් 73. 08. 20 වන දින සිට දකුණු කොළඹ මහෙස්ත්‍රාත් උසාවියේ දැන්වීම් පුවරුවේ ප්‍රදර්ශනය කරනු ලැබේ. උසාවියේදී එම භාණ්ඩ පෙ. ව. 11 සිට බැලිය හැක. භාණ්ඩ මිලදී ගත් වහාම මුදල් ගෙවා, රැගෙන යා යුතුයි. සියළුම ගෙවීම් ව්‍යවහාර මුදලින් කළ යුතුයි.

එෆ්. ජී. බී. ප්‍රනාන්දු,
දකුණු කොළඹ මහෙස්ත්‍රාත්,

මහෙස්ත්‍රාත් උසාවිය,
දකුණු කොළඹ.

7–669—73.07.20 දින අංක 69 දරණ ගැසට් පත්‍රය

---

## ආණ්ඩුවේ නොවන දැන්වීම්

#### දැන්වීමයි

නිකවැරටියේ "කමලසිරි" යෙහි නිවැසි කෝ. ඒ. කමලාවතී මැණිකේ කරුණාතිලක වන මම මෙදින පටන් පුරා මසක් ගත වූ තැන කුරුණෑගල දිස්ත්‍රික් උසාවි බල මණ්ඩලය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස්වරියක වශයෙන් ඇතුළත් වීම සඳහා නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට අවසර දෙන ලෙස රෙජිස්ත්‍රාර් ජනරාල් තුමාගෙන් ඉල්ලා සිටින බව නොතාරිස් ආඥාපනතේ 1 වැනි උපලේඛනයේ "ආ" ආකෘතිපත්‍රයේ 2 වැනි වගන්තියේ ප්‍රකාර මෙයින් දැනුම් දෙමි.

කෝ. ඇම්. කරුණාතිලක.

"කමලසිරි",
නිකවැරටිය.
73.7.6.

7–603—73.07.20 දින අංක 69 දරණ ගැසට් පත්‍රය

---

#### නොතාරිස් කෙනෙකු ලෙස පත් කරනු ලැබීම පිණිස අවසර ඉල්ලීමයි

කුරුණෑගල අධිකරණ දිස්ත්‍රික්කය තුල නාරම්මල රම්මුතුගල පදිංචි ඔව්විගලගේ චාලි කරුනානායක වන මම කුරුණෑගල දිස්ත්‍රික්කය තුල සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු වශයෙන් කටයුතු කිරීමට රෙජිස්ට්‍රාර් ජනරාල් තුමාගෙන් අවසර ඉල්ලා සිටින බව 91 පරිච්ඡේදයේ නොතාරිස් ආඥාපනතේ පළමුවන උපලේඛනයේ "ආ" කොටසේ දෙවන ව්‍යවස්ථාවේ ප්‍රකාර මෙයින් දැනුම් දෙමි.

ඕ. සී. කරුනානායක.

73.6.7.

7–599—73.07.20 දින අංක 69 දරණ ගැසට් පත්‍රය

---

#### නොතාරිස් අවසාන පරීක්ෂණයට ඉල්ලීමට පෙරාතුව කෙරෙන නීත්‍යානුකූල දැන්වීමයි

ශ්‍රී ලංකාද්වීපයේ මධ්‍යම පළාතේ මහනුවර දිසාවේ මහනුවර වට්ටාරන්තැන්න පාරේ අංක 46/8 දරණ තැන පදිංචි නිමල් දේවගේ රන්දෙණිය වන මම මහනුවර දිස්ත්‍රික්කයේ සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු වශයෙන් ඇතුලත්වීම සඳහා නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට අවසර දෙන ලෙස රෙජිස්ට්‍රාර් ජනරාල් තුමාගෙන් ඉල්ලා සිටින බව නොතාරිස් ආඥාපනතේ 107 වන පරිච්ඡේදයේ 7 වන වගන්තියේ පළමුවන උපලේඛනයේ "ආ" කොටසේ දෙවන නියෝගය ප්‍රකාර මෙයින් දන්වා සිටිමි.

එන්. ඩී. රන්දෙණිය.

වර්ෂ 1973 ක් වූ ජූලි මස 4 වන දින,
මහනුවරදීය.

7–598—73.07.20 දින අංක 69 දරණ ගැසට් පත්‍රය

---

#### නොතාරිස් අවසාන පරීක්ෂණයට ඉල්ලීමට පෙරාතුව කෙරෙන නීත්‍යානුගත දැන්වීමයි

කඩවත මහරනුගේගොඩ "තිළිණ" හි පදිංචි මානාදිපතිරන් නැහැලාගේ ලීලාවතී තිසේරා වන මම සිංහල නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීම සඳහා රෙජිස්ට්‍රාර් ජනරාල් තුමා වෙත අයදුම්පතක් ඉදිරිපත් කරන බව මෙයින් දැනුම් දෙමි.

එම්. එල්. තිසේරා.

1973.7.3.

7–596—73.07.20 දින අංක 69 දරණ ගැසට් පත්‍රය

**නොතාරිස් අවසාන පරීක්ෂණයට ඉල්ලීමට පෙරාතුව කරන නීත්‍යානුගත දැන්වීමයි**

කොළඹ දිස්ත්‍රික්කයේ සියනෑ කෝරළේ උඩුගහපත්තුවේ 'රුග්ගහවිල' වල්පොල පදිංචි කලුතන්තිරිගේ පියසීලි සෝමලතා වන මම මෙදින සිට පුරා මසක් ගතවූ පසු කොළඹ දිස්ත්‍රික්කය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු වශයෙන් කටයුතු කිරීම පිණිස නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට අවසර දෙන ලෙස රෙජිස්ට්‍රාර් ජනරාල් තැනගෙන් ඉල්ලා සිටින බව නොතාරිස් ආඥාපනතේ 107 වන ඡේදයේ 7 වෙනි වගන්තියේ ප්‍රකාර මෙයින් දන්වා සිටිමි.

9.7.1973,
උඩුගහවල්පොල (58),
රුග්ගහවිල.

කේ. පී. සෝමලතා.

7-595—73.07.20 දින අංක 69 දරණ ගැසට් පත්‍රය

---

**දැන්වීමයි**

කෑගල්ල දිස්ත්‍රික්කයේ රඹුක්කන නාවගමුවේ පදිංචි බමුණුආරච්චිගේ සර්නේලිස් පෙරේරා වන මම සිංහල නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීම සඳහා රෙජිස්ට්‍රාර් ජනරාල්තුමා වෙත අයදුම් පතක් ඉදිරිපත් කරන බව මෙයින් දැනුම් දෙමි.

බී. එස්. පෙරේරා.

73.07.06.

7-604—73.07.20 දින අංක 69 දරණ ගැසට් පත්‍රය

---

**නොතාරිස් අවසාන විභාගයට පෙනී සිටීමට පෙර කරනු ලබන නීත්‍යානුකූල දැන්වීම**

කුරුණෑගල දිස්ත්‍රික්කයේ අලව්වේ පදිංචි පුංචි මුදියන්සෙලාගේ පොඩිරාලහාමි ජයතිලක වන මම අද සිට පුරා මාසයක් ගත වූ පසු කුරුණෑගල දිස්ත්‍රික්කයේ සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිඩ නොතාරිස්වරයෙකු වශයෙන් ඇතුලත්වීම පිණිස නොතාරිස් අවසාන විභාගයට පෙනී සිටීමට රෙජිස්ට්‍රාර් ජනරාල් තුමාගෙන් අවසර ඉල්ලා සිටින බව නොතාරිස් ආඥාපනතේ 7 වන වගන්තිය ප්‍රකාර මෙයින් දැනුම් දෙමි.

පී. ඇම්. පී. ජයතිලක.

1973.06.25.

7-612—73.07.20 දින අංක 69 දරණ ගැසට් පත්‍රය

---

**දැන්වීමයි**

දඹදෙණි හත්පත්තුවේ උඩපොලමේතොට කෝරළේ වැල්ලැවේ පදිංචි විරසේකර මුදියන්සෙලාගේ හිංගිරිබණ්ඩා වන මම මෙදින සිට පුරා මාසයක් ගතවූ පසු කුරුණෑගල දිස්ත්‍රික්කයේ සිංහල භාෂාවෙන් කටයුතු කරණ ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු වශයෙන් ඇතුලත්වීම පිණිස නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීම සඳහා අවසර දෙන ලෙස රෙජිස්ට්‍රාර් ජනරාල්තුමාගෙන් ඉල්ලා සිටින බව නොතාරිස් ආඥාපනතේ 107 අධිකාරයේ 7 වෙනි වගන්තියේ "ආ" උපලේඛනයෙහි ප්‍රකාර මෙයින් දන්වා සිටිමි.

ඩබ්ලිව්. ඇම්. හිංගිරිබණ්ඩා.

වැල්ලැව,
9.7.73.

7-613—73.07.20 දින අංක 69 දරණ ගැසට් පත්‍රය

---

**දැන්වීමයි**

කොළඹ දිස්ත්‍රික්කයේ උතුරු අලුත්කුරු කෝරළේ බී. කොට්ඨාශයේ දසියපත්තුවේ ගල්ලෙ ගෙදර (ලිපිනය: ගම්පහ කොළඹ පාර අංක 105) නිවැසි දොන් ගුණතිලක බියන්විල වන මම, කොළඹ දිස්ත්‍රික්කයෙහි සිංහල භාෂාවෙන් වැඩ කරන නොතාරිස් කෙනෙකු ලෙස ඇතුලත්වීම සඳහා නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට අවසර දෙන ලෙස රෙජිස්ට්‍රාර් ජනරාල් තුමාගෙන් ඉල්ලා සිටින බව නොතාරිස් ආඥාපනතේ 7 වෙනි වගන්තියේ ප්‍රකාර මෙයින් දැනුම් දෙමි.

ඩී. ජී. බියන්විල.

1973.7.2,
අංක 105, කොළඹ පාර, ගම්පහ.

7-616—73.07.20 දින අංක 69 දරණ ගැසට් පත්‍රය

---

**නොතාරිස් අවසාන පරීක්ෂණයට ඉල්ලීමට පළමුව කරන දැන්වීමයි**

කොළඹ දිස්ත්‍රික්කයේ වේයන්ගොඩ කුඹල්ඔලුවේ පදිංචි වීරක්කොඩි අප්පුහාමිල්ලාගේ චන්ද්‍රසේන යන මම මෙදින සිට පුරා මාසයක් ගතවූ පසු කොළඹ දිස්ත්‍රික්කයේ සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු වශයෙන් ඇතුලත්වීම පිණිස නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීම සඳහා අවසර දෙන ලෙස රෙජිස්ට්‍රාර් ජනරාල් තුමාගෙන් ඉල්ලා සිටින බව නොතාරිස් ආඥාපනතේ (107 අධිකාරය) 7 වැනි වගන්තියේ ප්‍රකාර මෙයින් දන්වා සිටිමි.

චන්ද්‍රසේන වීරක්කොඩි.

1973. 7. 9.

7-618—73.07.20 දින අංක 69 දරණ ගැසට් පත්‍රය

---

**දැන්වීමයි**

මහනුවර ඉහළබෝවල අංක 62 දරන ස්ථානයේ පදිංචි රණසිංහ මුදියන්සෙලාගේ ටිකිරිබණ්ඩා රණසිංහ වන මම අද දින සිට පුරා මාසයක් ගතවූ පසු මහනුවර දිස්ත්‍රික්කයේ සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු ලෙස ඇතුලත් කර ගන්නා මෙන් රෙජිස්ට්‍රාර් ජනරාල් තුමාගෙන් ඉල්ලා සිටින බව නොතාරිස් ආඥාපනතේ 107 ඡේදයේ 7 වැනි වගන්තියේ පළමු උපලේඛනයේ "බී" කොටසේ 2 වැනි නියෝගය පරිදි රජයට සහ මහජනයාටත් මෙයින් දැනුම් දෙමි.

ටී. බී. රණසිංහ.

1973. 7. 5.

7-611—73.07.20 දින අංක 69 දරණ ගැසට් පත්‍රය

---

**නොතාරිස් අවසාන පරීක්ෂණයට ඉල්ලීමට ප්‍රථම කෙරෙන නීත්‍යනුගත දැන්වීමයි**

වලස්මුල්ලේ පදිංචි පෝද්දුව කංකානම්ගේ ජෝන් සිරිල් වන මම, හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු වශයෙන් ඇතුලත්වීම පිණිස නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට වර්ෂ 1907 අංක 1 දරණ නොතාරිස් ආඥාපනතේ 7 වැනි වගන්තියේ ප්‍රකාර රෙජිස්ට්‍රාර් ජනරාල් තුමාගෙන් ඉල්ලා සිටින බව මෙයින් දැනුම් දෙමි.

පී. කේ. ජේ. සිරිල්.

1973. 7. 10.

7-686—73.07.20 දින අංක 69 දරණ ගැසට් පත්‍රය

---

**දැන්වීමයි**

ජාඇල කොටුගොඩ පදිංචි නම්මිටගේ සලමොන් පෙරේරා සෙනෙවිරත්න වන මම සිංහල නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට අවසර ඉල්ලා රෙජිස්ට්‍රාර් ජනරාල්තුමා වෙත අයදුම් පතක් ඉදිරිපත් කරන බව මෙයින් දන්වමි.

ඇස්. පී. සෙනෙවිරත්න.

1973. 7. 10.

7-688—73.07.20 දින අංක 69 දරණ ගැසට් පත්‍රය

---

**දැන්වීමයි**

1973 ඔක්තෝබර් මාසයේ පැවැත්වෙන නොතාරිස් අවසාන විභාගයට අයදුම්පතක් ඉදිරිපත් කරන බව බළපිටියේ රේවතා මාවතේ, අංක 15 හේ පදිංචි කන්දළුඩ ඩර්වින් සිංඤෝ ද සිල්වා වන මම මෙයින් සියලුදෙනාටම දැනුම් දෙමි.

කේ. ඩී. ද සිල්වා.

1973. 07. 11.

7-684—73.07.20 දින අංක 69 දරණ ගැසට් පත්‍රය

### දැන්වීමයි

රත්මිවල මැණික්දිවෙල පදිංචි ලංකාධිපති විජයබාහු ගම්මුදලි වන මම අද දින සිට පුරාමාසයක් ගත වූ පසු මහනුවර දිස්ත්‍රික්කයේ සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු ලෙස ඇතුළත් කර ගන්නාමෙන් රෙජිස්ට්‍රාර් ජනරාල් තුමාගෙන් ඉල්ලා සිටින බව නොතාරිස් ආඥාපනතේ 107 ඡේදයේ 7 වැනි වගන්තියේ පළමු උපලේඛනයේ "බී" කොටසේ 2 වැනි නියෝගය පරිදි රජයට සහ මහජනයාටත් මෙයින් දැනුම් දෙමි.

එල්. ඩබ්ලිව්. ගම්මුදලි.

1973.7.5.

7-705 —73.07.20 දින අංක 69 දරණ ගැසට් පත්‍රය

---

### දැන්වීමයි

ඇතුල්ගම, තලාතුඔය, මහනුවර පදිංචි දොඩම්පේ රූපසිංහ මුදියන්සේලාගේ හෙන්ඩ්‍රික් රූපසිංහ වන මම කෑගල්ල දිස්ත්‍රික්කයේ සිංහල භාෂාවෙන් කටයුතු කරණ ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු වශයෙන් ඇතුල්වීම සඳහා නොතාරිස් අවසාන පරීක්‍ෂණයට පෙනී සිටීමට අවසර දෙන ලෙස රෙජිස්ට්‍රාර් ජනරාල් තුමාගෙන් ඉල්ලා සිටින බව නොතාරිස් ආඥාපනතේ 107 වන අධිකාරයේ "ඒ" උපලේඛනයේ 7 වන වගන්තියේ ප්‍රකාර මෙයින් දන්වා සිටිමි.

ඇතුල්ගම,
තලාතුඔය,
මහනුවර,
73. 7. 9

ඩී. ආර්. ඇම්. එච්. රූපසිංහ.

7-698—73.07.20 දින අංක 69 දරණ ගැසට් පත්‍රය

---

### නොතාරිස් අවසාන පරීක්ෂණයට ඉල්ලීමට පෙරාතුව කෙරෙන නීත්‍යානුකූල දැන්වීමයි

මිනුවන්ගොඩ පොල්වත්ත හන්දියේ පදිංචි වැල්ලේගේ ගුණරත්න සිල්වා වන මම, අද දින සිට පුරා මසක් ගතවූ පසු, මීගමු දිසාවේ සිංහල භාෂාවෙන් කටයුතු කරන, නොතාරිස් කෙනෙකු වශයෙන් ඇතුළත්වීම සඳහා නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට අවසර දෙන ලෙස රෙජිස්ට්‍රාර් ජනරාල් තුමාගෙන් ඉල්ලා සිටින බව නොතාරිස් ආඥාපනතේ 7 වන වගන්තියේ ප්‍රකාර මෙයින් දන්වා සිටිමි.

ඩබ්ලිව්. ජී. සිල්වා.

පොල්වත්ත හන්දිය,
මිනුවන්ගොඩ, 1973.07.01.

7-747—73.07.20 දින අංක 69 දරණ ගැසට් පත්‍රය

## විවිධ දැන්වීම්

### විද්‍යා අධ්‍යාපනයට අදාළ අතිරේක කියවීම් පොත් මිල දී ගැනීම

පාසැල් සිසුන් සඳහා විද්‍යාව පිළිබඳ අතිරේක කියවීම් පොත් පළ කිරීමට අනුබල දීමක් වශයෙන් රජය මඟින් එබඳු පොත් මිලයට ගැනීමේ ක්‍රමයක් අනුමත කොට තිබේ. ඒ ක්‍රමය අනුව මා විසින් පත් කරනු ලබන කාරක සභාවක් මඟින් සුදුසු යයි තෝරනු ලබන එක් එක් පොතින් පිටපත් එක් දහසකට (1000 කට) නොවැඩි ගණනක් 1973.12.31 න් අවසන් වන මුදල් වර්ෂය තුළ දී මිලට ගැනීමට අදහස් කරනු ලැබේ. තෝරා ගැනීමට සලකා බැලීම සඳහා ප්‍රකාශකයන් විසින් ඉදිරිපත් කරනු ලබන පොත් 1973 සැප්තැම්බර් මස 1 වැනි දාත් 1973 සැප්තැම්බර් මස 30 වැනි දත් අතර කාලය තුළ මා වෙත ලැබෙන සේ එවිය යුතුයි.

2. එසේ ඉදිරිපත් කරන පොත්—

(i) සිංහල මාධ්‍යයෙන් හෝ දෙමළ මාධ්‍යයෙන් හෝ ලියැවුණු අතිරේක විද්‍යා කියවීම් පොත් විය යුතුයි; නැතහොත් එම මාධ්‍යවලට පරිවර්තනය කැරුණු අතිරේක විද්‍යා කියවීම් පොත් විය යුතුයි,

(ii) 1973 ඔක්තෝබර් 1 වැනි දට පෙර අවුරුදු තුන තුළ දී පළමුවරට ප්‍රකාශයට පත් කරනු ලැබ 1973.10.1 දිනට පෙර අවුරුදු දෙක තුළ දී අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන මණ්ඩලය විසින් අතිරේක කියවීම් පොත් වශයෙන් සුදුසු යැයි සම්මත කරන ලද ඒවා විය යුතුයි. (මෙම කාල සීමාව තුළ එකී මණ්ඩලය වෙත සම්මතය සඳහා ඉදිරිපත් කරන ලද පොත් ද මෙම ක්‍රමයට ඇතුළත් කරනු පිණිස මා වෙත එවිය හැකියි. එහෙත් ඒවා ගැන සලකා බලනු ලබන්නේ 1973.10.1 දින වන විට එම මණ්ඩලය විසින් ඒවා සුදුසු යැයි සම්මත කැරුණොත් පමණි),

(iii) මීට කලින් වතාවක මෙම ක්‍රමය යටතේ මිලට ගැනීමට අනුමත නොවුණු ඒවා විය යුතුයි.

(iv) ලංකාවේ මුද්‍රණය කොට පළ කරන ලද ඒවා විය යුතුයි.

3. සෑම පොතක් ම ඉදිරිපත් කිරීමේ දී පහත සඳහන් ක්‍රියා පිළිවෙළ අනුගමනය කළ යුතුයි:

(අ) පොතේ පිටපත් දෙකක් එවිය යුතුයි.

(ආ) ඉහත 2(ii), 2(iii), 2(iv) යන ඡේද යටතේ කරුණු වෙන් වෙන් වශයෙන් සඳහන් කොට එසේ ම පොතේ විකුණුම් මිල ද සඳහන් කොට එම පොත සම්බන්ධයෙන් ඒ කරුණු සත්‍ය බවට ප්‍රකාශකයා විසින් අත්සන් කළ ලියවිල්ලක් ඉදිරිපත් කළ යුතුයි.

4. මිලට ගැනීම සඳහා තෝරා ගනු ලබන සෑම පොතක ම විකුණුම් මිලෙන් සියයට 10 ක වට්ටමක් අඩු කර එම පොත් දෙපාර්තමේන්තුවට විකිණීමට ප්‍රකාශකයා එකඟ විය යුතුයි.

5. තෝරා ගනු ලබන පොතකින් මිල දී ගැනීමට තීරණය කරන පිටපත් සංඛ්‍යාවේ විකුණුම් මිලෙන් යථොක්ත වට්ටම ද තවත් 10% ක මුදලක් ද අඩු කොට ඉතිරි වන මුදල ප්‍රකාශකයාට ගෙවනු ලැබේ. දෙවනු ව සඳහන් 10% ක මුදල, මුල් කෘතියක නම් එහි කර්තෘට ද පරිවර්තනයක නම් එහි පරිවර්තකයාට ද මා විසින් කෙළින්ම ගෙවනු ලැබේ.

ඩබ්. සී. සී. මහතන්තිල,
අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස්.

1973 ජූලි 1 දින,
කොළඹ, තැ. පෙ. 520,
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ දී ය.

7-666—73.07.20 දින අංක 69 දරණ ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊලඟ ගැසට් පත්‍රයේ එය පළකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින්ම ගෙවිය යුතුය.

සැ.යු.—මුදල් ගෙවා ගැසට් පතෙහි පළකරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරී වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

### උපලේඛනය

**1973**

| මාසය | පළකිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|---|
| ජූලි | 73.07.06 | සිකුරාද | ... 73.06.27 | බදාද | දවල් 12.00 |
| | 73.07.13 | සිකුරාද | ... 73.07.04 | බදාද | දවල් 12.00 |
| | 73.07.20 | සිකුරාද | ... 73.07.11 | බදාද | දවල් 12.00 |
| | 73.07.27 | සිකුරාද | ... 73.07.18 | බදාද | දවල් 12.00 |
| අගෝස්තු | 73.08.03 | සිකුරාද | ... 73.07.25 | බදාද | දවල් 12.00 |
| | 73.08.10 | සිකුරාද | ... 73.08.01 | බදාද | දවල් 12.00 |
| | 73.08.17 | සිකුරාද | ... 73.08.08 | බදාද | දවල් 12.00 |
| | 73.08.24 | සිකුරාද | ... 73.08.15 | බදාද | දවල් 12.00 |
| | 73.08.31 | සිකුරාද | .. 73.08.22 | බදාද | දවල් 12.00 |
| සැප්තැම්බර් | 73.09.07 | සිකුරාද | ... 73.08.29 | බදාද | දවල් 12.00 |
| | 73.09.14 | සිකුරාද | ... 73.09.05 | බදාද | දවල් 12.00 |
| | 73.09.21 | සිකුරාද | ... 73.09.11 | අඟහරුවාද | දවල් 12.00 |
| | 73 09 28 | සිකුරාද | ... 73.09.19 | බදාද | දවල් 12.00 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1972 ඔක්තෝබර් මස 20 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.